# පුණ්‍යානුමෝදනාව



**වුද්ධිකාරෝ අලිංගිත්වා**
**චුම්බිත්වා පිය බුත්තකං**
**රාජ මජ්ඣදං සුපතිට්ඨං**
**පීතු පාදං නමාමහං**

වසර 77 ක් අප අතරේ ජීවත්ව සිට, 2014.11.20 වන දින අප අතරින් සමුගත් **ජේ. විලියම් පෙරේරා** පියාණෙනි,

සිටින්නා වූ යම් ආත්මභාවයක සිට, අප විසින් ඔබ වෙනුවෙන් කරනු ලබන සියළු පිං අත්පත් කරගෙන, අනුමෝදන් වී, උපදින්නා වූ සෑම ආත්මභාවයක්ම නිදුක් නීරෝගී වී සුඛිත මුදිත ජීවිතයක් අත්පත් වන්නට මේ සියළු පිං හේතු වේවා. බුදු පසේ බුදු, මහ රහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වැඩියා වූ නිත්‍ය මංගල වූ පරම සුන්දර වූ අමා මහ නිවනම අවබෝධ වීම පිණිස ම මේ පුණ්‍ය ධර්මයන් හේතු වේවා. වාසනා වේවා.

මෙම ධර්ම පුස්තකය හුදී ජනයාගේ ධර්ම ඥාණය වැඩි දියුණු කර ගැනීමට පවුලේ සැම විසින් පරිත්‍යාග කරන ලදී.
දුරකතන : 0770 83 83 53

## බෝධි පූජාව හැඳින්වීම

'බෝධිය' යනු අවබෝධයයි. දුක්ඛ - සමුදය - නිරෝධ - මාර්ග යන චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධය 'බෝධි' නම් වේ. එම අවබෝධය ලැබීමට සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේට සෙවණ ලබාදුන් ඇසතු වෘක්ෂය ද බෝධි නමින් හඳුන්වයි. බුදු, පසේ බුදු, මහරහත් යන උතුමන් වහන්සේලා ද සෙසු ආර්ය පුද්ගලයන් වහන්සේලාද බෝධි නම් වෙති. බෝධි පාක්ෂික ධර්ම 37 ද බෝධි නමින් හඳුන්වයි.

## බෝධි පූජාව තබා වඳින ගාථා

**නමස්කාරය**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
(තුන් වරක් කියන්න)

**තෙරුවන් සරණ යෑම**

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

## පන්සිල් සමාදන්වීම හෝ අලුත් කර ගැනීම

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි



සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

## තෙරුවන් වැඳීම

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ
විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ
අනුත්තරෝ පුරිස ධම්ම සාරථී සත්ථා
දේව මනුස්සානං බුද්ධෝ භගවාති

නමාමි බුද්ධං ගුණසාගරංතං
සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායෝජුගුච්ඡෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි
යේ ච බුද්ධා අතීතා ච - යේ ච බුද්ධා අනාගතා
පච්චුන්නා ච යේ බුද්ධා අහං වන්දාමි සබ්බදා
නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමංගලං
උත්තමංගේන වන්දේහං - පාදපංසුවරුත්තමං
බුද්ධේ යෝ ඛලිතෝ දෝසෝ - බුද්ධෝ ඛමතු තං මමං

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සංදිට්ඨිකෝ අකාලිකෝ
ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං
වේදිතබ්බෝ විඤ්ඤූහීති

නමාමි ධම්මං සුගතේන දේසිතං
සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායෝජුගුච්ඡෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි
යේ ච ධම්මා අතීතා ච - යේ ච ධම්මා අනාගතා
පච්චුන්නා ච යේ ධම්මා අහං වන්දාමි සබ්බදා
නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං

ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමංගලං
උත්තමංගේන වන්දේහං - පාදපංසුවරුත්තමං
ධම්මෝ යෝ ඛලිතෝ දෝසෝ - ධම්මෝ ඛමතු තං මමං

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, යදිදං චත්තාරි පුරිස යුගානි, අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතෝ සාවක සංඝෝ, ආහුනෙය්‍යෝ, පාහුනෙය්‍යෝ, දක්ඛිනෙය්‍යෝ, අඤ්ජලිකරණීයෝ, අනුත්තරං, පුඤ්ඤක්ඛෙත්තං, ලෝකස්සාති.

නමාමි සංඝං මුණිරාජ සාවකං
සත්තා සදා හොන්තු සුඛි අවේරා
කායෝ ජුගුච්ඡෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි
යේ ච සංඝා අතීතා ච - යේ ච සංඝා අනාගතා
පච්චුන්නා ච යේ සංඝා අහං වන්දාමි සබ්බදා
නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමංගලං
උත්තමංගේන වන්දේහං - පාදපංසුවරුත්තමං
සංඝෝ යෝ ඛලිතෝ දෝසෝ - සංඝෝ ඛමතු තං මමං

සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සතිච්ච පරියෝ ද පනං - ඒතං බුද්ධානු සංසනං
(තෙවරක් කියන්න)

## බුදුන්ට මල් පූජා කිරීම

වණ්ණ ගන්ධ ගුණෝපේතං - ඒතං කුසුම සන්තතිං
පූජයාමි මුණින්දස්ස - සිරිපාද සරෝරුහේ



පූජේමි බුද්ධං කුසුමේනනේන
පුඤ්ඤේන මේ තේන ලභාමි මොක්ඛං
පුප්පං මිලායාති යථා ඉදංමේ
කායෝ තථායාතිවිනාස භාවං

*වර්ණයෙන් හා සුවඳින් පිරුණු මේ මල් සම්බුදු සිරිපා පද්මයට පූජා වේවා. බුදුරජාණන් වහන්සේට මේ මල් පූජා කරන පිනෙන් මොක් සැප ලැබීමට හේතු වේවා. ස්වභාවදහමට අනුව මේ මල් පරව යන සේ මගේ මේ කයද විනාශ වන්නේය.*

අනන්ත ගුණ වණ්ණස්ස - සුද්ධසිල සුගන්ධිනෝ
පූජේමි ලෝකනාතස්ස - චුප්ප මේතං මනෝරමං

ඉමිනා පුඤ්ඤකම්මේන - භවිත්වා සීලවා සදා
පප්පෝමි පරමං සන්තිං - නිබ්බාණං බුද්ධං වණ්ණිතං

*අනන්තගුණ වර්ණ ඇත්තාවූ, පවිත්‍ර වූ, සිල් සුවඳ ඇත්තාවූ ලෝකනාථ බුදුරජාණන් වහන්සේට මේ මනරම් මල් පූජා කරමි. මේ පිංකමෙන් සෑම කල්හි සිල් ඇත්තේ වී, බුදුරජාණන් වහන්සේ විසින් වර්ණනා කරන ලද පරම ශාන්තිය වූ නිර්වාණයට පැමිණෙත්වා*

## පහන් පූජා කිරීම

ඝනසාරප්ප දිත්තේන - දීපේන තමධංසිනා
තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං

*ඝන අඳුර දුරලා ආලෝකය දෙන මේ පහනින් භව අඳුර දුරලන පහන වැනි බුදුහිමියන් පුදමි*

වේනෙය්‍ය හදයේ මෝහ - තමෝක්ඛන්ධ විනෝදකං
දීපේනේතේන පූජේමි - පඤ්ඤාදීප ධරං ජිනං
ඉමිනා පුඤ්ඤකම්මේන - පඤ්ඤාවා සීලවා සදා
භවිත්වාන හේ සීසං - ධම්ම චක්ඛුං අනුත්තරං

*වේනෙය්‍ය ජනයන්ගේ මෝහය නැමැති අන්ධකාරස්කන්ධය දුරුකරන්නාවූ, ප්‍රඥා නැමැති ප්‍රදීපය දරන්නාවූ, පස් මරුන් දිනූ තථාගත බුදුරජාණන් වහන්සේට මේ ප්‍රදීපයෙන් පුදමි. මේ පිනෙන් - මම සෑම තැන්හිම නුවණ ඇතියෙකු වී අනුත්තර වූ දහම් ඇස - දහම් ඥානය ලබනෙම්වා*

## සුවඳ දුම් පූජා කිරීම

**ගන්ධසම්භාර යුත්තේන - ධූපේනාහං සුගන්ධිනා**
**පූජයේ  පූජනීයං තං - පූජාභාජන මුත්තමං**
*සුවඳ රසකින් යුතු මෙම ධූපයෙන් පිදිය යුත්තාවූ පිදුමට බඳුන් වූ බුදුරජාණෝ පුදමි.*

**සුගන්ධිකාය වදනං අනන්ත ගුණගන්ධිනා**
**සුගන්ධිනාහං ගන්ධේන පූජයාමි තථාගතං**
*අපමණ ගුණ සුවඳින් සුවඳවත් වූ වදන් ඇති තථාගතයන් වහන්සේ සුවඳින් පුදමි*

## සිසිල් පැන් පූජාව

**සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං**
**පානීය මේතං භගවා - පතිගණ්හාතු මුත්තම**
*භාග්‍යවතුන් වහන්ස, පිළිගැනීමට සුදුසු වූ මේ පිරිසිදු සිසිල් පැන් අනුකම්පා පෙරදැරිව ඉවසා වදාරණ සේක්වා*

## ආහාර පූජා කිරීම

**අධිවාසේතු නෝ භන්තෙ - භෝජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

## ගිලන්පස පූජා කිරීම

**අධිවාසේතු නෝ භන්තෙ - භේසජ්ජං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

## පහන් පූජා කිරීම

**ඝනසාරප්ප දිත්තේන - දීපේන තමධංසිනා**
**තිලොක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං**

## දැහැත් පූජා කිරීම

**නාගවල්ලී දළුපෙතං - චුණ්ණපූග සමායුතං**
**තාම්බූලං පතිගණ්හාතු - සතං පූජේමි දංජිනො**



## පැන් පූජා කිරීම

**සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං**
**පානීය මේතං භගවා - පතිගණ්හාතු මුත්තමං**

## සියලු චෛත්‍යයන් වැඳීම

**බුද්ධං ධම්මංච සංඝං සුගත තනුභවා ධාතුයෝ ධාතුගබ්බේ,**
**ලංකායං ජම්බුදීපේ තිදස පුරවරේ, නාග ලොකේච ථූපේ**
**සබ්බේ බුද්ධස්ස බිම්බේ සකල දසදිසේ කේසලෝමාදි ධාතුං**
**වන්දේ සබ්බේපි බුද්ධං දසබල තනුජං බෝධි චෛත්‍යං නමාමි**

**වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිට්ඨිතං**
**ශාරීරිකධාතු මහා බෝධිං - බුද්ධ රූපං කසලං සදා**
*බුදුපිළිම වහන්සේලාද, මහා බෝධීන් වහන්සේලාද, බුද්ධ ශරීර ධාතු සහිත ස්තූපයන්ද නමදිමි*

## සොළොස්මස්ථාන වැඳීම

**මහියංගණං නාගදීපං - කල්‍යාණං පදලාඤ්ජනං**
**දිවාගුහං දීඝවාපී - චෙතියඤ්ච මුතියංගණනං**
**තිස්ස මහා විහාරඤ්ච - බෝධිං මරිචවට්ටියං**
**සොණ්ණමාලී මහා චෛත්‍යං - ථූපාරාම භයාගිරිං**
**ජේතවනං සේල චෛත්‍යං - තථා කාචර ගාමකං**
**ඒතෙ සෝලස්ඨානානි - අහං වන්දාමි සබ්බදා**

## දළඳා වහන්සේ වැඳීම

**ලෝකේකනාථ වදනම්බුජ රාජහංසං**
**වෙනෙය්‍යකෝමුද විකාසන සිතරංසිං**
**අද්ධින්දුකාර වරරූප විරාජමානං**
**වන්දාමි සාධු මමලං ජිනදන්තධාතුං**

## නාගදීප චෛත්‍ය වැඳීම

**භගිනී සුත මාතුලේහි දින්නේ -**
**මණි පල්ලංකවරේ යහිං නිසින්නෝ**
**මුනි ධම්ම දේසයි පණීතං -**
**සිරසා තං පනමාමි නාගදීපං**

## කැලණි චෛත්‍ය වැඳීම

ආයාචනාය මණිඅක්ඛි මහෝරගස්ස
යස්මිං නිසීදි භගවා මණිමණ්ඩපස්මිං
තස්සෝ පරිට්ඨිත මුපට්ඨීත වීතරාගං
කල්‍යාණ චේතියමහං සිරසා නමාමි

## ශ්‍රී පාද පද්මය වැඳීම

කල්‍යාණතෝ ගගනතෝ මුනි යත්ථ ගන්ත්වා
දස්සේසී චක්කවර ලක්ඛණ පදලාඤ්ඡනං
ලංකාමහීවර වධූ මකුටෝපමාණං
වන්දාමහං සුමන කූට සිලුච්චයං තං

## ස්වර්ණමාලී චෛත්‍යය වැඳීම

සයිංසු යස්මිං සුගතස්ස ධාතුං
නිම්මාය රංසුජ්ජල බුද්ධ රූපං
සුවණ්ණ මාලිති පතීත නාමං
වන්දාමහං ථූප වරං මහග්ඝං

## බෝධි වන්දනා ගාථා

**යස්ස මූලේ මහා සත්තෝ - ජෙත්වා මාරං මහබ්බලං**
**පත්තෝ සබ්බඤ්ඤුතං සෙට්ඨං - වන්දේ තං බෝධිමුත්තමං**
*යම් බෝධි මූලයකදී මහා බෝධිසත්වයන් වහන්සේ මහත් බල ඇති මාරයා පරදවා සියල්ල දත් බුදුබවට පැමිණි සේක්ද උත්තම වූ ඒ බෝධීන් වහන්සේට වඳිමි*

**යස්ස මූලේ නිසීදිත්වා - සත්තාහං ලෝකනායකෝ**
**විමුත්තිසුඛ සංවේදී - වන්දේ තං බෝධිමුත්තමං**
*ලෝකනායක වූ තථාගතයන් වහන්සේ යම් බෝධියක මුල වැඩ සිට සතියක් මුළුල්ලෙහි විමුක්ති සුවය වින්දේ ද ඒ උත්තම බෝධීන් වහන්සේට වඳිමි*

**යස්ස පූජේසි සම්බුද්ධෝ - සත්තාහං සකලෝචනේ**
**පූජිතං නරදේවේහි - වන්දේ තං බෝධිමුත්තමං**



*බුදුරජාණන් වහන්සේ සතියක් මුළුල්ලෙහි යම් බෝරුකකට තමන් වහන්සේගේ නේත්‍රයන් පූජා කළ සේක්ද ඒ උත්තම බෝධීන් වහන්සේට වඳිමි*

**ආයුං අරෝගතං වණ්ණං - යසං කිත්තිං ධනං බලං**
**වඩ්ඪෙන්තං පූජයන්තානං - වන්දේ තං බෝධිමුත්තමං**
*පුදන්නවුන්ට ආයුෂ නිරෝගී බව ශරීර වර්ණය යසස කීර්තිය ධනය බලය, මේවා වර්ධනය කරන්නා වූ උත්තම බෝධීන් වහන්සේ වඳිමි*

**දුක්ඛං රෝගං භයං වේරං - සෝකං ජානිං උපද්දවං**
**හරන්තං පූජයන්තානං - වන්දේ තං බෝධිමුත්තමං**
*පූජා කරන්නන්හට දුකය රෝගය ය. බියය. වෛරයය ශෝකයය පිරිහීම ය උපද්‍රවයය යන මේවා දුරු කරන්නා වූ උත්තම වූ බෝධීන් වහන්සේට වඳිමි*

**පුඤ්ඤකාමේහි විඤ්ඤූහි - නරදේවේහි සාදරං**
**වන්දිතං පූජිතං සෙට්ඨං - වන්දේ තං බෝධිපාදපං**
*පින් කැමති නුවණැති දෙව් මිනිසුන් විසින් වඳින්නා වූ පුදන්නා වූ උත්තම බෝධීන් වහන්සේට වඳිමි*

**සබ්බකාම දදෝ බෝධී - සබ්බදුක්ඛ විනාසකෝ**
**වන්දතෝ දේතු මේ සන්තිං - බෝධිරාජ නමත්ථු තේ**
*සියලු කැමති දෑ දෙන්නා වූ සියලු දුක් නසන්නා වූ බෝධීන් වහන්සේ වඳින්නා වූ මා හට ශාන්තිය ගෙන දේවා. බෝධිරාජයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා*

**ඉන්ද නීල වණ්ණ පත්ත සේතබන්ධ භාසුරං**
**සත්ථු නෙත්ත පංකජාභි පූජිතග්ග සාදතං**
**අග්ග බෝධි නාම වාම දේව රුක්ඛ සන්නිභං**
**තං විසාල බෝධ පාදපං නමාමි සබ්බදා**
ඉඳුනිල් පැහැය ගත් බෝපත්ය. සුදු වර්ණයෙන් බබළන බෝ කඳය, බුදුරදුන්ගේ නෙත් පියුමින්, පුද ලද එම බෝධිය, සත්හට මොක් සුව ලබාදෙයි. අග්ගබෝධි නමින් පතල දෙව් රුකකට සමකළ හැකි ඒ සුවිසල් බෝ සමිඳුන් සැමදා මම නමදිමි.

**යස්ස මූලේ නිසින්නෝව - සබ්බාරිවිජයං අකා**
**පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා - වන්දේ තං බෝධිපාදපං**
*යම් බෝධි මූලයක වැඩ හුන්නා වූ ශාස්තෲන් වහන්සේ සියලු සතුරන් දිනූ සේක් ද උතුම් වූ සියල්ල දන්නා පුද්ගලයා බවට පැමිණි සේක්ද ඒ බෝධීන් වහන්සේ වඳිමි*

**සුපතිට්ඨිත රට්ඨානුරාධපුරේ සමදිට්ඨිත දක්ඛිණ ශාඛ බවං**
**සුභ මේඝවනම්බර මේඝ නිභං ජය බෝධි මහං පණමාමි වරං**
*සම්මා සම්බුදුරජාණන් වහන්සේ එදා අධිෂ්ඨාන කළ පරිද්දෙන්, අනුරාධපුරේ මහාමේඝ වනයේ පිහිටුවන ලද ඒ උතුම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දකුණු ශාඛාව වඳිමි.*

**ඉමේ ඒතේ මහා බෝධී - ලෝක නාථේන පූජිතා**
**අහංපිතේ නමස්සාමී - බෝධිරාජා නමත්ථුතෙ**
*මේ බෝධීන් වහන්සේ ලෝක නාථවූ බුදුරජාණන් වහන්සේ විසින්ද සත්දිනක් පුරා අනිමිස ලෝචන පූජාවෙන් පුදන ලද්දාහ. මමද ඒ බෝධිරාජයාණන් වහන්සේට නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා*

## බෝධීන් වහන්සේට මල්, පහන්, සුවඳු දුම්, පැන්, ගිලන්පස, දැහැත් පිදීම

**සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධිමුත්තමං**
**පූජේමි බෝධිරාජානං - පුප්ඵේනේතේන සාදරං**

**සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධිමුත්තමං**
**පූජේමි බෝධිරාජානං - දීපේනේතේන සාදරං**

**සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධිමුත්තමං**
**පූජේමි බෝධිරාජානං - ධූපේනේතේන සාදරං**

**සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධිමුත්තමං**
**පූජේමි බෝධිරාජානං - උදකේනේතේන සාදරං**

**සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධිමුත්තමං**
**පූජේමි බෝධිරාජානං - ගිලානපච්චයං ඉමං**



**සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධිමුත්තමං**
**පූජේමි බෝධිරාජානං - තාම්බුලං පරිකප්පිතං**

**සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධිමුත්තමං**
**පූජේමි බෝධිරාජානං -සබ්බං සද්ධාය පූජිතං**
*ධම්මරාජයන් විසින් සම්‍යක් සම්බෝධියට පැමිණීම සඳහා සේවනය කරන ලද්දා වූ බෝධිරාජයාණන් වහන්සේට මේ මල්, පහන්, සුවඳ දුම්, පැන්, ගිලන්පස, හා දැහැත් සාදරයෙන් පූජා කරමි. පූජා වේවා.*

## බෝධිරාජයාණන් වහන්සේ අභියස සෙත් පැතීම

**මහාදයෝ මහාසත්තෝ - බෝධිමූලේ නිසීදිය**
**පඤ්ච මාරේ පරාජේත්වා - පත්තෝ සම්බෝධිමුත්තමං**
**ඒතේන සච්චවජ්ජේන - සොත්ථි මේ හෝතු සබ්බදා**
*මහත් වූ දයාව ඇත්තා වූ මහා සත්ත්වයන් වහන්සේ බෝධී මූලයේ වැඩ හිඳ පස් මරුන් පරදවා උතුම් සම්බෝධියට, බුද්ධත්වයට පැමිණි සේක. ඒ සත්‍ය වචනයේ ආනුභාවයෙන් මා හට සැප වේවා*

**ජයෝ හි බුද්ධස්ස සිරිමතෝ අයං**
**මාරස්ස ච පාපිමතෝ පරාජයෝ**
**උග්ඝෝසයුං බෝධිමණ්ඩේ පමෝදිතා**
**ජයං තදා නාග ගණා මහෝසිනෝ**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**
*ශ්‍රීමත් වූ මේ බුදුරජාණන් වහන්සේට ජය වුයේය. පාපී වූ මාරයා හට පරාජය අත් වූයේය. මේ බෝ මැඩ රැස්වූ නාග සමූහයෝ සතුටු වුවාහු බුදුරජාණන් වහන්සේගේ ජය ඝෝෂාව කළෝය. ඒ සත්‍යානුභාවයෙන් සුවයක් වේවා*

**ජයෝ හි බුද්ධස්ස සුබෝධිමූලේ**
**මාරස්ස ච පාපිමතෝ පරාජයෝ**
**උග්ඝෝසයුං බෝධිමණ්ඩේ පමෝදිතා**
**ජයං තදා නාග ගණා මහේසිනෝ**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**
*ශ්‍රීමත් වූ මේ බුදුරජාණන් වහන්සේට ජය වුයේය. පාපී වූ මාරයා හට පරාජය අත් වූයේය. මෙසේ සතුටට පත් සුපර්ණ දේව සමූහයෝ*

*සතුටු වුවාහු බුදුරජාණන් වහන්සේගේ ජය ඝෝෂාව කළෝය. ඒ සත්‍යානුභාවයෙන් සුවයක් වේවා*

**ජයෝ හි බුද්ධස්ස සිරිමතෝ අයං**
**මාරස්ස ච පාපිමතෝ පරාජයෝ**
**උග්ඝෝසයුං බෝධි මණ්ඩේ පමෝදිතා**
**ජයං තදා දේවගණා මහේසිනෝ**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

*ශ්‍රීමත් වූ මේ බුදුරජාණන් වහන්සේට ජය වුයේය. පාපී වූ මාරයා හට පරාජය අත් වූයේය. මේ බෝ මැඩ රැස්වූ දේව සමූහයෝ සතුටු වුවාහු බුදුරජාණන් වහන්සේගේ ජය ඝෝෂාව කළෝය. ඒ සත්‍යානුභාවයෙන් සුවයක් වේවා*

**ජයෝ හි බුද්ධස්ස සිරිමතෝ අයං**
**මාරස්ස ච පාපිමතෝ පරාජයෝ**
**උග්ඝෝසයුං බෝධිමණ්ඩේ පමෝදිතා**
**ජයං තදා බ්‍රහ්මගණාපි තාදිනෝ**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

*ශ්‍රීමත් වූ මේ බුදුරජාණන් වහන්සේට ජය වුයේය. පාපී වූ මාරයා හට පරාජය අත් වූයේය. මෙසේ එදා බෝමැඩ දී සතුටු වූ බ්‍රහ්ම සමූහයෝ බුදුරජාණන් වහන්සේගේ ජය ඝෝෂාව කළෝය. ඒ සත්‍යානුභාවයෙන් සුවයක් වේවා.*

මේ ගාථා පස බෝධිමූලයේදී කියා අන්‍යයන්ට සෙත් කිරීමටද යෝග්‍යය. ආතුරයා ලවා බෝධීන් වහන්සේ වන්දවා මල් පහන් ආදිය පූජා කරවා බෝධිය සමීපයේ හිඳවා මේ ගාථා තුන්වරක් හෝ සත් වරක් හෝ කියා සෙත් කරනු. අනුන්ට සෙත් කිරීමේදී පළමුවන ගාථාවේ අන්තිම පදය සොත්ථි තේ හෝතු සබ්බදා යි කියනු. අපල ලෙඩ හා වෙනත් කරදර ඇති අයට මෙයින් බොහෝ ගුණ ලැබෙනු ඇත. රෝගියා බෝධිය වෙත පැමිණීමට නොහැකි තත්ත්වයක සිටි නම් ඔහු වෙනුවට බෝධියට මල් පහන් පුදා සිටිනා තැනට ගොස් ගාථා කියා සෙත් කරනු.



අනුරාධපුරයේ මහමෙවුනා උයනෙහි වැඩ සිටින දක්ෂිණ ශාඛා ශ්‍රී මහා බෝධීන් වහන්සේට කරන පූජාවක් ලෙස සලකා කොතැනක හෝ බෝධියක් සමීපයේ මල්, පහන්, සුවඳ, සුවඳ දුම් කොඩි පැන් ආදී වස්තූන් පුද වැඳ ආතුරයා ලවා දෙවියන්ට පින් දෙවා ඔහු බෝධිය සමීපයේ හිඳුවා ගෙන මෙසේ සෙත් කරනු.

## නවග්‍රහ සෙත් ශාන්තිය

| | |
|---|---|
| අරහං බුදු ගුණෙන් මගේ හිරුගේ අපල | දුරුවේවා |
| ලෙඩ දුක් බිය නොවී කිසිත් සැපත සතුට | ලංවේවා |
| සම්මා සම්බුද්ධ තෙදින් සඳුගේ අපල | දුරුවේවා |
| මාරක බාධක වැලකී මගේ පැතුම් | ඉටුවේවා |
| විජ්ජාචරණේ බලයෙන් අඟහරු දොස් | ඉගිලේවා |
| වස විසි ගිනි සතුරු විපත් මා වෙත ලං | නොමවේවා |
| සුගතෝ බුදු ගුණෙන් මගේ බුදගේ අපල | දුරුවේවා |
| ගුණ නුවණින් වැඩී සියලු සැප සම්පත් | ඉතිරේවා |
| ලෝකවිදූ තෙදින් මගේ ගුරුගේ දෝෂ | දුරුවේවා |
| සතුට සමාදානය මට නිරෝගී සුව | වැඩිවේවා |
| අනුත්තරෝ බුදු ගුණයෙන් සිකුරු අපල | දුරුවේවා |
| සිතුමිණ වැනි රුවන් ගැබක ආයුස මගේ | වැඩිවේවා |
| පුරිසදම්ම සාරථී බල මහිමෙන් සැඩ | සෙනසුරාගෙ |
| අකල විකල භූත දෝස ගැටුම් වැටුම් | හා බන්ධන |
| දුරැර සියලු මෙකී දෝෂ විලස සාධු | ජය බෝරුක |
| ජනපඤ්ජරයක් වේවා සෙනසුරු | දොස් දුරුවේවා |
| සත්ථා බුදුගුණෙන් මගේ රාහු අපල | දුරුවේවා |
| යක්ෂ ප්‍රේත වින බන්ධන අහෝසි වී | සැප වේවා |

භගවා යන විදුරවියෙන් කේතු අපල ඉගිලේවා
මගේ කයට බසට සිතට සැප සන්තොස වැඩිවේවා.

මකර කුම්භ මිතුන තෙරුස මාරක බිය දුරුවේවා
කැපි කෝටියක්ම දෝෂ මට ජය මග එළිවේවා.

සිංහ මේස ධනු තුන්රුස සැම ග්‍රහදොස් දුරුවේවා
තිසරණ සරණින් ජයසිරි සුභසෙත මට ලංවේවා

මීන කටක නුහුනු තෙරුස බාධක බිය දුරුවේවා
ජීවසිද්ධි බලය මගේ බුදු සරණින් සුරුකේවා

වෘෂභ කන්ති තුලා තෙරුස සැම ග්‍රහදොස් දුරුවේවා
දම්සරණින් මගේ අපල දුරුවී සිරි සෙත වේවා

රාහු කේතු රවි සඳු කුජ බුද ගුරු කිවි සහ සෙනසුරු
නීච පාප අපල මගේ සඟ සරණින් වේවා දුරු

තෙරුවන් ගුණ සුවඳ අමා ඔසුවෙන් මට සැපවේවා
මගේ දෙර අයට මටද ජය සිරි සෙත ලංවේවා

නවග්‍රහ සහ භූත දෝස සැම දුරු වී සැප වේවා
ජය බෝරුක මුණි පිට දුන් මට ජය සේසත වේවා

ජයසිරිමා බෝ රජුගේ දක්ෂිණ ශාඛා සෙවනේ
දීප ධූප මල් සුවඳින් ගිලන් පසින් පුද දෙමිනේ

දහස් දෙනා එක් රොක් වී කරන මෙපින් මෙත් සිතිනේ
මියගිය අප නෑ මිතුරන් සැම දෙන පින් ලැබ ගන්නේ

## පිරිතට ආරාධනා කිරීම

විපත්තී පටිභාහාය - සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ දුක්ඛ විනාසාය - පරිත්තං බ්‍රෑහි මංගලං
විපත්තී පරිභාහාය - සබ්බ සම්පත්ති සිද්ධියා



සබ්බ භය විනාසාය - පරිත්තං බ්‍රෑහි මංගලං
විපත්තී පටිභාහාය - සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ රෝග විනාසාය - පරිත්තං බ්‍රෑහි මංගලං

*(පිංවත් ස්වාමීන් වහන්ස, විපත්ති කරදර දුරුවීම පිණිස සෞභාග්‍ය උදාවීම පිණිස, සියලු දුක් දුරුවීම පිණිස, සියලු භය දුරුවීම පිණිස, සියලු රෝග දුරුවීම පිණිස, ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින්, මහා කරුණාවෙන් දේශනා කොට වදාළ, උතුම් සූත්‍ර දේශනා, තුන්යම් රාත්‍රිය මුළුල්ලේ අප කෙරෙහි අනුකම්පාවෙන්ම, දේශනා කරන සේක්වා.)*

## දේවතා ආරාධනය

සමන්තා චක්කවාලේසු - අත්‍රා ගච්ඡන්තු දේවතා
සද්ධම්මං මුනිරාජස්ස - සුණන්තු සග්ග මොක්ඛදං
පරිත්තස්සවණ කාලෝ - අයං භදන්තා
පරිත්තස්සවණ කාලෝ - අයං භදන්තා
පරිත්ත ධම්මස්සවණ කාලෝ - අයං භදන්තා

## පිරිත් පේ කිරීම

නමෝ තස්ස භගවතෝ අරහතෝ .............
ඉතිපිසෝ භගවතෝ . . . . .
ස්වාක්ඛාතෝ භගවතෝ . . . .
සුපටිපන්නෝ භගවතෝ . . . .

## රතන සූත්‍රය

1. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං
*(මෙතැන්හි රැස්වූ පොළොවෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද අහසෙහි වූ ද යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද ඒ සියලු අමනුෂ්‍යයෝම සතුටු සිතැත්තෝ වෙත්වා, තවද මගේ වචනය අසත්වා. . .)*

2. තස්මා හි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවාච රත්තෝච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

*(භූතයිනි, එබැවින් සියලු තෙපි මගේ වචනය අසවු මිනිස් ප්‍රජාවට මෛත්‍රි කරවු යම් කෙනෙක් දහවල්ද රෑද, පුද පඬුරු එළවත්ද එහෙයින් නොපමාවම ඔවුන් රකිවු.)*

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරංවා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(මේ මිනිස් ලොව හෝ නා ලොව ආදී අන් ලොවෙක හෝ යම් ධනයෙක් වේද, ස්වර්ගයෙහි හෝ යම්කිසි උතුම් රත්නයක් වේද, තථාගතයන් හා සදෘශයෙක් නොම ඇත්තේය. බුදුරදුන් කෙරෙහි රත්න  බවද උතුම්ය මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.)*

4. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(එකඟ වූ සිත් ඇති, සක්‍යමුණි තෙම ක්ෂය නම් වූ විරාග නම් වූ අමත නම් වූ යම් නිවනක් අවබෝධ කළේද, ඒ ධර්‍මයට සම වූ කිසිවක් නොමැත. ධර්‍මයෙහි මේ රත්නභාවයද උතුම්ය මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.)*

5. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයි සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු



*(ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ යම් ආර්ය මාර්ගයක් වර්ණනා කළ සේක්ද, යම් ධර්මයක් ආනන්තරික සමාධියයි කියත්ද, ඒ සමාධිය හා සමාන වූවක් නැත. ධර්මයෙහි මේ රත්නභාවය ද ප්‍රණීතය. ඒ සත්‍යයෙන් සුවයක් ලැබේවා)*

6. යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(සත්පුරුෂයන් විසින් පසස්නා ලද යම් ආර්ය පුද්ගලයෝ අටදෙනෙක් වෙත්ද, නොහොත්, ප්‍රශස්ත වූ යම් එකසිය අටක් ආර්ය  පුද්ගලයෝ වෙත්ද මොහු හැමදෙන සතර යුගල කෙනෙක් වෙති. සුගත් බුදුරදුන්ගේ ශ්‍රාවක වූ ඒ ආර්ය පුද්ගලයෝ දක්ෂිණාවට සුදුස්සෝ වෙති. මේ බඳු සව්වන් කෙරෙහි දෙන ලද දානයෝ මහත් පල ඇත්තෝ වෙත් සංඝයා කෙරෙහි මේ රත්නභාවයද උතුම්ය මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.)*

7. යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතමසාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(යම්කෙනෙක්  ස්ථිර වූ සිතින් මනාකොට යෙදුණාහුද ගෞතම නම් වූ තථාගත ශාසනයෙහි සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනාහුද ඔවුහු නිවනට බැස නොමිලයේ ලත් නිවන්සුව වළඳන්නාහු රහත් ඵලයට පැමිණියාහු නම්වෙත් සංඝයා කෙරෙහි මේ රත්නභාවයද උතුම්ය මේ සත්‍ය බලයෙන් සෙත් වේවා)*

8. යථින්දඛීලෝ පඨවිංසිතෝසියා
චතුබ්භිවාතේභි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(යම්සේ පොළොවෙහි යටට බැසගත් ඉන්ද්‍රඛීලය තෙම සිවු දිගින් හමන සුළඟින් සෙළවිය හැකි නොවේද යම් ආර්ය පුද්ගලයෙක් චතුරාර්ය සත්‍යය නුවණින් අවබෝධ කළේද, ඒ සත්පුරුෂයා ඒ ඉන්ද්‍රඛීලය බඳු යයි කියමි. සංඝයා කෙරෙහි මේ රත්නභාවයද උතුම්ය මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.)*

9. යේ අරිය සච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(යම් සෝවාන් පුගුල් කෙනෙක් ගැඹුරු නුවණැති බුදුරජුන් විසින් මනාකොට දෙසන ලද චතුරාර්ය සත්‍යයන් තුමූ අවබෝධ කෙරෙත්ද, ඔවුහු බෙහෙවින් පමාවූවාහු නමුදු කිසිසේත් ඔවුහු අටවන භවයක් නොගනිති. සංඝයා කෙරෙහි මේ රත්නභාවයද උතුම්ය. මේ සත්‍ය බලයෙන් සෙත්වේවා)*

10. සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතංවාපි යදත්ථි කිඤ්චි
චතුහපායේහි ච විප්පමුත්තෝ
ඡචාභි ඨානානි අභබ්බෝකාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(මේ සෝවාන් පුද්ගලයා ගේ දර්ශන සම්පත්තිය හා සමගම සෝවාන් මග නුවණ පහළවීම සමග සක්කායදෘෂ්ටියද,*



*විචිකිත්සාවද, යම්කිසි ශීලව්‍රතාදියක් හෝ ඇද්ද කියන ලද සංයෝජන ධර්යෝ තිදෙන දුරුකරන ලද්දාහු වෙත්ද හෙතෙම සිවු අපායෙන්ද මිදුනේ වේ. සවැදෑරුම් බරපතල පාපයන් කරන්නට නුසුදුසුය. මෙයද සංඝයා කෙරෙහි උතුම් රත්නභාවය වේ. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා. )*

11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(ඒ සෝවාන් පුද්ගලයා කයින්, වචනයෙන් හෝ සිතින් යම්කිසි පවක් කෙරේද, හෙතෙම එය වසාගෙන සිටීමට අයෝග්‍යය. ඒ පව වසාගෙන සිටීමට සෝවාන් පුද්ගලයා අභව්‍යයයි වදාරණ ලදී. සංඝයාගේ මේ රත්න භාවයද ප්‍රණීතය. ඒ සත්‍යයෙන් සුවයක් ලැබේවා.)*

12. වනප්පගුම්බේ යථාඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිංගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයි
නිබ්බාණගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(ග්‍රීෂ්ම ඍතුවෙහි ප්‍රථම මාසයෙහි වන ලැහැබ මනාව සුපිපි අක් ඇත්තේ ශෝභාවත් වේද, ඒ හා සමාන වූ නිවන් පමුණුවන ධර්මය නිවන පිණිසම දෙසූ සේක. බුදුරදුන් කෙරෙහි මේ රත්නභාවයද ප්‍රණීතය. ඒ සත්‍යයෙන් සුවයක් ලැබේවා.)*

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයි
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

*(උතුම් වූ නිවන දන්නා වූ නිවන දෙන්නා වූ උතුම් නිවන්*

*මග ගෙනහැර පාන්නා වූ, නිරුත්තර වූ භාග්‍යවතුන් වහන්සේ උතුම් වූ ධර්මය දෙසූ සේක. බුදුන් කෙරෙහි මේ රත්නභාවයද ප්‍රණීතය. ඒ සත්‍යයෙන් සුවයක් වේවා.)*

14. **ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං**
**විරත්තචිත්තා ආයතිකේ භවස්මිං**
**තේ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා**
**නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

*(යම් රහත් කෙනෙකුගේ පුරාතනකර්ම ක්ෂීණවූයේද අලුත භවයක් නැත්තේද මතුභවයක් කෙරෙහි නොඇලුණු සිත් ඇති, පුනරුත්පත්තියෙහි ආශාවක් නැති, ධෛර්යසම්පන්න වූ ඒ රහත්හු මේ පහනමෙන් පිරිනිවෙත් සංඝයා කෙරෙහි මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.)*

15. **යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානිව අන්තලික්ඛේ**
**තථාගතං දේවමනුස්සපූජිතං**
**බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු**

*(මෙතැන්හි රැස්වූ භූමියෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් වෙත්ද, ඒ අපි හැමදෙනාගේම තථාගත වූ දෙව් මිනිසුන් විසින් පුදන ලද බුදුන් වඳුම්හ, සත්හට සුව වේවා)*

16. **යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානිව අන්තලික්ඛේ**
**තථාගතං දේවමනුස්සපූජිතං**
**ධම්මං නමස්සාම සුවත්ථි හෝතු**

*(මෙතැන්හි රැස්වූ භූමියෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් වෙත්ද, ඒ අපි හැමදෙනාගේම දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත ධර්මය වඳුම්හ. සත්හට සුව වේවා)*

17. **යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානිව අන්තලික්ඛේ**



**තථාගතං දේවමනුස්සපූජිතං**
**සංඝං නමස්සාම සුවත්ථි හෝතු**

*(මෙතැන්හි රැස්වූ භූමියෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනේක වෙත්ද, ඒ අපි හැම දෙනම තථාගතයන්ගේ දෙව් මිනිසුන් පුදන ලද ආර්ය සංඝයා වඳුම්හ. සත්හට සෙත් වේවා.)*

## කරණීය මෙත්ත සූත්‍රය

1. **කරණීයමත්ථ කුසලේන**
**යං තං සන්තං පදං අභිසමෙච්ච**
**සක්කෝ උජූ ච සුජූ ච**
**සුවචෝ චස්ස මුදු අනතිමානි**

*(ශාන්ත පදයට (හෙවත් නිවනට) පැමිණ වසනු කැමැත්තෙහු විසින් යමක් කළ යුතුද? (හෙතෙම) සමර්ථයෙක් වන්නේය. අවංක වන්නේය. මැනවින් අවංක වන්නේ ය කීකරු වන්නේය. මෘදු වන්නේය. නිහතමානි වන්නේය.)*

2. **සන්තුස්සකෝ ච සුභරෝ ච**
**අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති**
**සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච**
**අප්පගබ්බෝ කුලේසු අනනුගිද්ධෝ**

*(ලද දෙයින් සතුටු වන්නේය. පහසුවෙන් පෝෂණය කළ හැක්කේය. ස්වල්ප කටයුතු ඇත්තෙක් වන්නේය. සැහැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නේය. සන්සුන් ඉඳුරන් ඇත්තෙක් වන්නේය. නුවණ ඇත්තෙක් වන්නේය. කුලයන් කෙරෙහි නොඇලුනේ වන්නේය.)*

3. **න ච ඛුද්දං සමාචරේ කිඤ්චි**
**යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං**
**සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා**

*(යම් ක්‍රියාවකින් නුවණැති අන් කෙනෙක් නින්දා කෙරෙත්ද එබඳු ස්වල්ප වූ වරදකුදු නොකරන්නේය. සියලු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා. භය නැත්තෝ වෙත්වා. සුඛිත සිත් ඇත්තෝ වෙත්වා.)*

4. යේ කේචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා -
මජ්ඣිමා රස්සකාණුකථූලා

*(කෙලෙස් සහිත බැවින් භයින් ත්‍රස්ත වූ හෝ නිර්භය හෙයින් ස්ථාවර වූ සියලු යම්කිසි සත්ව කෙනෙක් වෙත්ද යම් සත්ව කෙනෙක් ඇත්තාහුද මහත් සිරුරු ඇත්තාහුද මධ්‍යම ප්‍රමාණ සිරුරු ඇත්තෝ ද ඉතා සියුම් සිරුරු ඇත්තෝද ස්ථූල සිරුරු ඇත්තෝද සුඛිත සිත් ඇත්තෝ වෙත්වා)*

5. දිට්ඨා වා යේව අද්දිට්ඨා -
යේ ච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසීවා -
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

*(ඇසට පෙනෙන්නාවූ හෝ නොපෙනෙන්නා වූ යම් සත්ව කෙනෙක් වෙත්ද යම් සත්ව කෙනෙක් දුර වෙසෙත්ද නුදුරෙහි වෙසෙත්ද ඉපදීම අවසන් කළ සත්වයෝ වෙත්ද ඉපදීම සොයන සත්වයෝ ද සියලු සත්වයෝ සුඛිත සිත් ඇත්තෝ වෙත්වා.)*

6. න පරෝ පරං නිකුබ්බේථ -
නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

*(අනිකෙක් අනිකකු නොරවටන්නේය. කිසි තැනෙක්හි ඒ කිසිවක්හට අවමන් නොකරන්නේය. කායවාක් විකාරයෙන් වූ කෝපයෙන්ද මනෝ විකාරයෙන් වූ එකෙක් අනෙකකුට දුකක් නොකැමති වන්නේය.)*

7. මාතා යථා නියංපුත්තං - ආයුසා ඒකපුත්තමනුරක්ඛේ
ඒවම්පි සබ්බභූතේසු - මානසං භාවයේ අපරිමාණං

*(යම්සේ මවක් තමාගෙන් ඇති වූ එකම පුතු දිවි පිදීමෙන් හෝ රකීද හැම සතුන් කෙරෙහි අප්‍රමාණ වු මෛත්‍රී සිත වඩන්නේය.*



8. මෙත්තං ච සබ්බලෝකස්මිං
මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියඤ්ච
අසම්බාධං අවේරං අසපත්තං

*(උඩද යටද, සරසද සම්බාධ නැතිව වෛර නැතිව සතුරන් නැති සියලු සත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සහගත සිත වඩන්නේය.)*

9. තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

*(සිටින්නේ හෝ ඇවිදින්නේ හෝ උන්නේ හෝ නිදන්නේ හෝ යම්තාක්කල් නොනිදා ඒ තාක් මේ මෛත්‍රී සහගත සිහිය පවතින්නේය මෙය මේ ශාසනයෙහි බ්‍රහ්ම විහාරයයි බුද්ධාදී උතුමෝ කීහ.)*

10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති

*(මිථ්‍යාදෘෂ්ටියට නොපැමිණ සිල්වත් වූයේ දර්ශනයෙන් යුක්ත වූයේ වස්තුකාමයන්හි ගිජුබව දුරුකොට ඒකාන්තයෙන් මවුකුස පිළිසිඳ ගැනීමට නැවත නොඑන්නේය.)*

## ජය පිරිත

**සිරි ධිති මති තේජො ජයසිද්ධි මහිද්ධි මහා ගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස. භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස.**

**ද්වත්තිංස මහා පුරිසලක්ඛණානුභාවේන අසීත්‍යනුව්‍යඤ්ජන ලක්ඛණානුභාවේන අට්ඨුත්තරසතමංගල ලක්ඛණානුභාවේන. ඡබ්බණ්ණ**

රංසයානුභාවේන කෙතුමාලානුභාවේන දසපාරමිතානුභාවේන දසඋප පාරමිතානුභාවේන. දසපරමත්ථ පාරමිතානුභාවේන, සීලසමාධි පඤ්ඤානුභාවේන, බුද්ධානුභාවේන, ධම්මානුභාවේන, සංඝානුභාවේන, තේජානුභාවේන. ඉධ්‍යානුභාවේන. බලානුභාවේන. ඤෙය්‍යධම්මානුභාවේන. චතුරාසීතිසහස්ස ධම්මක්ඛන්ධානුභාවේන, නවලොකුත්තරධම්මානුභාවේන අට්ඨංගිකමග්ගානුභාවේන. අට්ඨසමාපත්ත්‍යානුභාවේන. ජලභිඤ්ඤානුභාවේන. මෙත්තා, කරුණා මුදිතා උපෙක්ඛානුභාවේන. සබ්බපාරමිතානුභාවේන. රතනත්තයසරණානුභාවේන තුය්හං සබ්බරෝග සෝක උපද්දව දුක්ඛදෝමනස්සුපායාසා විනස්සන්තු. සබ්බසංකප්පා තුය්හං සමිජ්ඣන්තු දීඝායුකෝ හෝතු සතවස්සජීවේන සමංගිකෝ හෝතු සබ්බදා.

ආකාස පබ්බත වනභූමිතටාකගංගා මහාසමුද්දආරක්ඛක දේවතා සදා තුම්හෙ අනුරක්ඛන්තු. සබ්බබුද්ධානුභාවේන සබ්බධම්මානුභාවේන සබ්බසංඝානුභාවේන බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං තින්නං රතනානං ආනුභාවේන චතුරාසීති සහස්සධම්මක්ඛන්ධානුභාවේන. පිටකත්තයානුභාවේන. ජිනසාවකානුභාවේන සබ්බේ තෙ රෝගා. සබ්බේ තේ භයා. සබ්බේ තෙ අන්තරායා. සබ්බේ තෙ උපද්දවා. සබ්බේ තෙ දුන්නිමිත්තා. සබ්බේ තෙ අවමංගලා විනස්සන්තු -

ආයුවඩ්ඪකෝ, ධනවඩ්ඪකෝ, සිරිවඩ්ඪකෝ, යසවඩ්ඪකෝ, බලවඩ්ඪකෝ, වණ්ණවඩ්ඪකෝ, සුඛවඩ්ඪකෝ, හෝතු සබ්බදා.

දුක්ඛරෝගභයාවේරා - සෝකා සබ්බේ උපද්දවා
අනේකා අන්තරායාපී - විනස්සන්තු ච තේජසා
ජය සිද්ධි ධනං ලාභං - සොත්ථිභාග්‍යං සුඛං බලං
සිරි ආයුච වණ්ණො ච - භොගං වුද්ධී ච යසවා
සතවස්සා ච ආයු ච - ජීවසිද්ධිභවන්තු තේ



සෞභාග්‍යයෙන් ධෛර්‍යයෙන් නුවණින් හා තේජසින් උපලක්ෂිත ජය සිදු කරන මහා සෘද්ධිමත් මහා ගුණයෙන් හා අප්‍රමාණ පුණ්‍ය මහිමයෙන් යුත් සියළු අනතුරු වැලකීමෙහි සමත් වූ භාග්‍යවත්, අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරිස ලක්ෂණ ආනුභාවයෙන්, අසූවක් අනුකුඩා ලකුණුවල ආනුභාවයෙන් සවනක් (ෂඩ් වර්ණ) රැස් ආනුභාවයෙන්, කේතුමාලානුභාවයෙන්, දස පාරමිතානුභාවයෙන්, දස උප පාරමිතානුභාවයෙන්, දස පරමත්ථ පාරමිතානුභාවයෙන්, සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවන්ගේ ආනුභාවයෙන්, බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන්ගේ ආනුභාවයෙන් තේජසින්, සෘද්ධියෙන්, බලයෙන් හා දතයුතු දේ දැන වදාළ නුවණේ ආනුභාවයෙන්, නව ලොව්තුරු දහමේ ආනුභාවයෙන්, අෂ්ඨ සමාපත්ති ආනුභාවයෙන් සය අභිඥාවන්ගේ ආනුභාවයෙන්, මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සිව් බඹ විහරණයන්ගේ ආනුභාවයෙන් ඔබගේ, මගේ සියළු රෝග, සෝක, කරදර, දුක් දොම්නස් බලවත් සිත් වේදනා, වැනසේවා (දුරුවේවා)

ඔබගේ සියළු යහපත් කල්පනාවන් ඉටුවේවා. සියක් වසක් කල් ජීවත් වීමට ශක්තිය ලැබේවා. සියළු කල්හි අහස, පර්‍වත, වන, බිම්, තටාක, ගංගා හා මහ සයුර අරක් ගත්, දෙවියෝ ඔබේ රැකවරණය සලසත්වා. සියලු බුදුවරයන්ගේ සියලු ධර්මයේ හා සියලු සංඝයාගේ ආනුභාවයෙන් බුද්ධ ධම්ම සංඝ යන තෙරුවන්ගේ ආනුභාවයෙන්, ත්‍රිපිටකයේ ආනුභාවයෙන් බුද්ධ ශ්‍රාවකයින් වහන්සේලාගේ ආනුභාවයෙන් ඔබේ සියලු රෝග, සියලු භය, සියලු අනතුරු, සියලු කරදර, සියලු අසුභ නිමිති, සියලු සිත් නොපිනවන දේ වැනසෙත්වා. (දුරු වෙත්වා)

සියලු කල්හි ආයුසින්, ධනයෙන්, යසසින්, බලයෙන්, වර්ණයෙන් හා සැපයෙන් වර්ධනය වේවා. දුක්, රෝග, භය, වෛර, සෝක, කරදර සමනය වේවා. නොයෙක් අතුරු අන්තරාවන් තේජසින් විනාශ වේවා. ජයසිද්ධිය,

ධන ලාභය, සුව සම්පත, වාසනාව, සැප බලය හා ආයුෂයද, වර්ණ සම්පතද, භෝගයන්ගේ වර්ධනය ද කීර්තියද සිය වසකට අධික කාලයක් ආයු වැඩීමේ ජීව සිද්ධිය ද ඔබට වෙත්වා.

## මහා ජයමංගල ගාථා

**මහා කාරුණිකෝ නාථෝ හිතාය සබ්බපාණිනං**
**පූරෙත්වා පාරමී සබ්බා පත්තෝ සම්බෝධිමුත්තමං**
**ඒතේන සච්චවජ්ජේන හෝතු තේ ජයමංගලං**
*(මහා කාරුණිකයන් වහන්සේ සියලු සත්වයින්ට හිත පිණිස සියලු පාරමී ධර්මයන් සම්පූර්ණ කොට උතුම් බුද්ධත්වයට පැමිණි සේක. ඒ සත්‍ය වචනය කරන කොට ගෙන මට ජය මංගල්‍යයක් වේවා)*

**ජයන්තො බෝධියා මූලේ සක්‍යානං නන්දිවද්ධනෝ**
**ඒවං තුය්හං ජයෝ හෝතු ජයස්සු ජයමංගලං**
*(ශාක්‍යයන්ගේ සතුට වඩන්නා වූ බුදුරජාණන් වහන්සේ බෝ මුලහිදී මරුන් දිනූ සේක. ඒ හේතුවෙන් මට ජයක්ම වේවා. ජය මංගල්‍යයක් වේවා)*

**සක්කත්වා බුද්ධරතනං ඕසධං උත්තමං වරං**
**හිතං දේවමනුස්සානං බුද්ධතේජේන සොත්ථිනා**
**නස්සන්තු පද්දවා සබ්බේ දුක්ඛා වූපසමෙන්තු තේ**
*(දෙව් මිනිසුන්ට හිතවත් වු උතුම් ඖෂධයක් වැනි වූ බුද්ධ රත්නයට සත්කාර කිරීම නිසාද බුද්ධ තේජසින් ද සකලෝපද්‍රයෝ නැසෙත්වා. මාගේ දූඃඛයෝ සංසිඳෙත්වා)*

**සක්කත්‍වා ධමමරතනං - ඕසධං උත්තමං වරං**
**පරිළාහූපසමනං - ධම්මතේජේන සොත්ථිනා**
**නස්සත්තු පද්දවා සබ්බේ - භයා වූපසමෙන්තු තේ.**
*(රාගාදී දූවිලි සංසිඳවීමට උතුම් බෙහෙතක් වූ ධර්ම රත්නයට සත්කාර කිරීම් හේතුවෙන් හා ධර්ම රත්නයෙහි තේජසින් සියළු උපද්‍රවයෝ නැසෙත්වා. මගේ භය සංසිඳේවා)*

**සක්කත්වා සංඝරතනං ඕසධං උත්තමං වරං**
**ආහුනෙය්‍යං පාහුනෙය්‍යං සංඝතේජේන සොත්ථිනා**



**නස්සන්තු පද්දවා සබ්බේ රෝගා වූපසමෙන්තු තේ**
*(ආහුනෙය්‍ය වූ පාහුනෙය්‍ය වූ උත්තම ඖෂධයක් වූ සංඝරත්නයට සත්කාර හේතුවෙන් හා සංඝතේජසින් සියළු උපද්‍රවයන් නැසේවා. මගේ රෝග සංසිඳේවා.)*

**යං කිංචි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ**
**රතනං බුද්ධසමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ**
*(ලෝකයේ විවිධ වූ බොහෝ රත්නයෝ විද්‍යාමාන වෙත්ද, එහෙත් බුද්ධ රත්නය හා සමාන රත්නයක් නැත. ඒ සත්‍යයෙන් මට යහපතක්ම වේවා.)*

**යං කිංචි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ**
**රතනං ධම්මසමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ**
*(ලෝකයේ විවිධ වූ බොහෝ රත්නයෝ විද්‍යාමානවෙත්ද, එහෙත් ධම්ම රත්නය හා සමාන රත්නයක් නැත. ඒ සත්‍යයෙන් මට යහපතක්ම වේවා)*

**යං කිංචි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ**
**රතනං සංඝසමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ**
*(මට අනිත් සරණක් නැත. බුදුරජාණන් වහන්සේ මට එකම පිහිටයි. ඒ සත්‍යයෙන් මට ජය මංගල්‍යයක් වේවා.)*

**නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං**
**ඒතේන සච්චවජ්ජේන හෝතු තේ ජයමංගලං**
*(මට අනිත් සරණක් නැත. බුද්ධ රත්නය මට එකම පිහිටයි. ඒ සත්‍යයෙන් මට ජය මංගල්‍යයක් වේවා)*

**නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං**
**ඒතේන සච්චවජ්ජේන හෝතු තේ ජයමංගලං**
*(මට අනිත් සරණක් නැත. ධර්ම රත්නය මට එකම පිහිටයි. ඒ සත්‍යයෙන් මට ජය මංගල්‍යයක් වේවා)*

**නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං**
**ඒතේන සච්චවජ්ජේන හෝතු තේ ජයමංගලං**

*(මට අනිත් සරණක් නැත. සංඝ රත්නය මට එකම පිහිටයි. ඒ සත්‍යයෙන් මට ජය මංගල්‍යයක් වේවා)*

## මෝර පරිත්තං (බෝසත් මොණරා ගැන වදාළ දෙසුම)

**උදයට කිවයුතු කොටස**

**උදේතයං චක්ඛුමා ඒකරාජා**
**හරිස්සවණ්ණෝ පඨවිප්පභාසෝ**
**තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං**
**තයජ්ජ ගුත්තා විහරේමු දිවසං**

**යේ බ්‍රාහ්මණා වේදගු සබ්බ ධම්මේ**
**තේ මේ නමෝ තේච මං පාලයන්තු**
**නමත්ථු බුද්ධානං  නමත්ථු බෝධියා**
**නමෝ විමුත්තානං නමෝ විමුත්තියා**
**ඉමං සෝ පරිත්තං කත්වා  මෝරෝ චරති ඒසනා**

*(ඇස් ඇති ඒකරාජ වූ රන්වන් වූ පොළොව බබුළුවන්නා වූ මේ හිරු තෙම නැගෙයි එහෙයින් රන්වන් වූ පොළොව බබුළුවන තා වඳිමි. තා විසින් අද රක්නා ලද මේ දවස සුවසේ වසමු.)*

**සවසට කිව යුතු කොටස**

**අපේතයං චක්ඛුමා ඒකරාජා**
**හරිස්ස වණ්ණෝ පඨවිප්පභාසෝ**
**තං තං නමස්සාමි හරිස්ස වණ්ණං**
**පඨවිප්පභාසං තයජ්ජ ගුත්තා විහරේමු දිවසං**

**යේ බ්‍රාහ්මණා වේදගු සබ්බ ධම්මේ**
**තේ මේ නමෝ තේ ච මං පාලයන්තු**
**නමත්ථු බුද්ධානං  නමත්ථු බෝධියා**
**නමෝ විමුත්තනං නමෝ විමුත්තියා**
**ඉමං සෝ පරිත්තං කත්වා - මෝරෝ වාසමකප්පයිතී.**



*(යම් ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ කෙනෙක්, සියළු ඥෙය ධර්මයන් දන සම්‍යක්සම්බෝධියට පැමිණියෝද, ඔවුන්ට මාගේ නමස්කාරය වේවා. ඒ භාග්‍යවත්හුදු මා රකිත්වා. පෙර බුදුවරුනට නමස්කාරය වේවා. සතරමහ සතර ඵලයයි කියන ලද බෝධියට නමස්කාර වේවා. කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ ඒ බුදුවරයන්ට නමස්කාර වේවා. පඤ්ච විමුක්තියට නමස්කාර වේවා. ඒ මයුර තෙම මේ පිරිත ආරක්ෂා කොටගෙන අහර සෙවීමෙහි හැසිරෙයි)*

***(මෙම මෝර පිරිත උදේ සවස භාවිතා කිරීම වධ බන්ධනාදියට අසු නොවීමට වස විෂ හදි හූනියම් වලින් මිදීමට හා දීර්ඝායුෂ ලැබීමට හේතුවෙයි)***

## සෙත්ශාන්ති ගාථා

**සබ්බීතියෝ විවජ්ජන්තු - සබ්බරෝගෝ විනස්සතු**
**මා තේ භවත්අන්තරායෝ - සුඛී දීඝායුකෝ භව**

**භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බදේවතා**
**සබ්බ බුද්ධානුභාවේන - සදා සොත්ථී භවන්තු මෙ.**

**භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බදේවතා**
**සබ්බ ධම්මානුභාවේන - සදා සොත්ථී භවන්තු මෙ.**

**භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා**
**සබ්බ සංඝානුභාවේන - සදා සොත්ථී භවන්තු මෙ.**

*(සියලු උවදුරු දුරුවේවා, සියලු රෝග නැසේවා, සියලු අන්තරාය දුරුවේවා, දීර්ඝායු ලැබේවා, සියලු මංගල්‍යයන් වේවා, සියලු දෙවියෝ රකිත්වා, සියලු බුදුවරුන්ගේ, සියලු ධර්මයේ, සියලු සඟුන්ගේ ආනුභාවයෙන් සැමදා සෙතක් වේවා.)*

**ඉමිනා පුඤ්ඤකම්මේන - මාමේ බාල සමාගමෝ**
**සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා**

**සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා**
**සචිත්තරියෝදපනං - ඒතං බුද්ධාන සාසනං**

නක්ඛත්තයක්ඛ භූතානං - පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවේන - හන්තු මය්හං උපද්දවෙ

*(නක්ෂත්‍ර යක්ෂ භූත පාප ග්‍රහ යන මොවුන්ගේ වැළැක්මෙන් පිරිතෙහි ආනුභාවයෙන් සියලු උවදුරු නැසේවා)*

දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හේතුච
ඵීතෝ භවතු ලෝකෝච - රාජා භවතු ධම්මිකෝ

සබ්බේ බුද්ධා බලප්පත්තා - පච්චේකානඤ්ච යං බලං
අරහන්තානංච තේජේන - රක්ඛං බන්ධාමි සබ්බසෝ

(තෙවරක් කියන්න)

*සියලු බුදුවරුන්ගේද පසේ බුදුවරුන්ගේද රහතුන්ගේද යම් බලයක් වේද ඒ තේජසින් හැම අයුරින්ම ආරක්ෂා කරමි)*

සබ්බාවමඞ්ගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ග්‍රහදෝසමසේසනින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාවපවරේන පායාතු නාසං

*(සියලු අවමංගල උවදුරු, නරක පෙර නිමිති, සියලු බිය අසනීප ලෙඩරෝග, ග්‍රහ අපල, නින්දා අපවාද, සියලු සතුරු අන්තරා නරක සිහින පෙනීම, පරුෂපවාද ආදි ව්‍යසනයන් සියල්ල බුද්ධානු භාවයෙන් ඉතිරි නැතිව විනාශයට පත්වේවා)*

සබ්බාවමඞ්ගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ග්‍රහදෝසමසේසනින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
ධම්මානුභාවපවරේන පායාතු නාසං

*(ධර්මානු භාවයෙන් ඉතිරි නැතිව විනාශයට පත්වේවා)*

සබ්බාවමඞ්ගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ග්‍රහදෝසමසේසනින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
සංඝානුභාවපවරේන පායාතු නාසං

*(සංඝානුභාවයෙන් ඉතිරි නැතිව විනාශයට පත්වේවා)*



## අනතුරු විපත් සහිත තදබල අපල ඇති අයට විශේෂ ගාථාවක්

පඨවිබල සුන්දරී - සබ්බඤ්ඤු බෝධි මණ්ඩලං
අසංඛ්‍යං මාරසේනං - ජයෝ ජයතු මංගලං

කකුසන්ධෝ කෝණාගමනෝ - කස්සපෝ ගෝතමෝ මුනි
මෙත්තෙය්‍ය පඤ්ච බුද්ධාතේ - සීසමේ සෙන්තුසබ්බදා

ඒතේසං ආනුභාවේන - යක්ඛා දේවා මහිද්ධිකා
සබ්බේපි සුඛිතා හොන්තු - මම මිත්තා සහායකා

සම්බුද්ධේ අට්ඨවීසංච - ද්වාසංච සහස්සකේ
පංචසත සහස්සානි - නමාමි සිරසාදරං

තේසං ධම්මංච සංඝංච - ආදරේන නමා මහං
නමක්කාරනුභාවේන - සබ්බේ භයා උපද්දවා
අනේකා අන්තරායාපි - විනස්සන්තු අසේසතෝ

*(බෝධි පූජා අවස්ථාවේ පමණක් නොව නිතර නිතර සිහිපත් කිරීමෙන් හා ගමන් බිමන වලදී සිතින් කියවීමෙන් තද විපත් අනතුරු ආදියෙන් බේරිය හැක)*

## දෙවියන්ට පිං දීම

කත්තං අම්හේහිමං පුඤ්ඤං - සබ්බ සම්පත්ති සාධකං
සබ්බේ දේවා අනුමෝදන්තු - අම්හේ රක්ඛන්තු සබ්බදා

*(අප විසින් කළා වූ මේ පින්, සකල සම්පත් සාධනය කරන සියළු දෙවියන්ට අනුමෝදන් වෙත්වා. දෙවියන් සැම කල්හී අප ආරක්ෂා කරත්වා)*

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු ලෝක සාසනං

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු දේසනං

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු මං පරං

*(අහසේ සහ පොළොවේ වෙසෙන තෙදැති දෙවියන්ද, නාගයන්ද,*

*මේ පින් අනුමෝදන් වී බොහෝ කාලයක් බුද්ධ ශාසනය ආරක්ෂා කරත්වා, බොහෝ කාලයක් මා හා අන් අය ආරක්ෂා කරත්වා, බොහෝ කාලයක් සම්බුද්ධ දේශනාව ආරක්ෂා කරත්වා)*

**එත්තාවතා ච අම්හේහි - සම්භතං පුඤ්ඤ සම්පදං**
**සබ්බේ දේවා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා**

**එත්තාවතා ච අම්හේහි - සම්භතං පුඤ්ඤ සම්පදං**
**සබ්බේ භූතා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා**

**එත්තාවතා ච අම්හේහි - සම්භතං පුඤ්ඤ සම්පදං**
**සබ්බේ සත්ථා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා**

## මියගිය ඤාතීන්ට පිං දීම

**කතං අම්හේහිමං පුඤ්ඤං - සබ්බ සම්පත්ති සාධකං**
**ඤාතයෝ අනුමෝදන්තු - පරලෝකමිතෝ ගතා**
*(මේ පිං සියළු මිය පරලොව ගිය ඤාතීන්ට අනුමෝදන් කරමි. අනුමෝදන් වෙත්වා. ඔවුන් අප ආරක්ෂා කරත්වා)*

**ඉදං මේ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ**
**ඉදං මේ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ**
**ඉදං මේ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ**

**ගන්ධං දීපංච ධූපංච - පානියං භෝජනං පිව**
**පතිගණ්හාතු සන්තුට්ඨා - ඥාති පේතා ඉදං බලි**
*(මියගොස් හත්දවස, තුන්මාසය, අවුරුද්ද වැනි දිනවල මළවුන්ට පූජා තැබීමේදී මේ ගාථාව භාවිතා කරන්න)*

## පින් දීමේ ගාථා

### සියලු දෙවියන්ට පින් දීම

**කතං අම්හේහිමං පුඤ්ඤං - සබ්බසම්පත්ති සාධකං**
**සබ්බේ දේවානුමෝදන්තු - අම්හේ රක්ඛන්තු සබ්බදා**
*අප විසින් කරන ලද සියලු සම්පත් සාදා දෙන මේ පින සියලු දෙවියෝ අනුමෝදන් වෙත්වා. අපද සෑම කල්හි ආරක්ෂා කරත්වා*



## විෂ්ණු දෙවියන්ට

**නීලවණ්ණෝ මහා තේජෝ - බලෝ ගුරුළ වාහනෝ**
**වේණු නාමෝ දේව රාජා - ඉමං පුඤ්ඤානුමෝදතු**
*නිල්වන් වූ මහා තේජස් ඇත්තා වූ බල ඇත්තා වූ ගුරුළු වාහනය ඇති විෂ්ණු නම් වූ දෙව් රජ තෙමේ මේ පින් අනුමෝදන් වේවා*

**සම්බුද්ධ ශාසනවරං යතිපුංගවංච**
**සම්පාලනාය පටිලද්ධ වරෝ මහිද්ධී**
**පුඤ්ඤානිමානි අනුමෝදිය වාසුදේවො**
**පාලේතු මං සතත සාතහිතා වහන්තෝ**

## කතරගම දෙවියන්ට

**සම්බුද්ධ ශාසන වරං ඉධ රෝහණස්මිං**
**සම්පාලනාය පටිලද්ධ වරෝ යසස්සී**
**පුඤ්ඤානුමෝදිය සළාතන දේවරාජා**
**පාලේතු මං සතත සාත  සුඛාවහන්තු**

**සළාතනෝ මහා තේජෝ - බලෝ මයුර වාහනෝ**
**දේවින්දෝ කාචරගාමේ - ඉමං පුඤ්ඤානුමෝදතු**
*මුහුණු සයක් ඇත්තා වූ මහත් තේජස් බල ඇත්තා වූ කතරගම දේවේන්ද්‍රයෝ මේ පින් අනුමෝදන් වෙත්වා*

## සමන් දෙවියන්ට

**සම්බුද්ධපාද වරලඤ්ජන සොභිතස්මිං**
**වාසො සමන්තගිරි මුද්ධනි දේවරාජා**
**පුඤ්ඤානුමෝදිය ඉදං සුමනාභිධානා**
**පාලේතු මං සතත සාත සුඛාවහන්තු**

**වාරණ වාහනෝ සම්මා - සම්බුද්ධ පද පාලකෝ**
**තේජස්සී සුමනෝ දේවෝ - ඉමං පුඤ්ඤානුමෝදතු**
*ශ්‍රී පාදය ආරක්ෂා කරන්නා වූ තේජස් ඇත්තා වූ ඇත් වාහන ඇත්තා වූ සුමන දෙව් තෙමේ මේ පින් අනුමෝදන් වේවා*

## දෙවියන් ඇතුලු සදේවක ලෝකයාට පින්දීම

**අබ්බෙසු දීප නගරේසු පි චක්ක වාලේ**
**දෙවා, සුරා ගරුඬ රක්ඛස නාග යක්කා**
**ආකාසට්ඨාච භුම්මට්ඨා, දෙවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු ලොක සාසනං**
**(තෙවරක් කියන්න)**

*මෙම බෝධිරාජයාණන් වහන්සේ වෙත අධිපති වන්නා වු සියලුම දෙවි දේවතාවුන් වහන්සේලාට, අද දින අප විසින් රැස් කරගන්නා ලද පුණ්‍ය සම්භාරය අයත් වේවා. සතුටු සිතින් අනුමෝදන් වෙත්වා.*

*සාධු සාධු සාධු*

## ප්‍රාර්ථනා ගාථා

**ඉමිනා පුඤ්ඤකම්මේන - මාමේ බාල සමාගමෝ**
**සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා**

*(මේ පින් බලයෙන් නිවන් දක්නා තුරු මට දුදන ඇසුරක් නොවේවා. සුදන ඇසුරම ලැබේවා)*

## මවට වැඳීම

**දසමාසේ උරේ කත්වා - පෝසේසි වුද්ධි කාරණං**
**ආයු දීඝං වස්ස සතං - මාතු පාදං නමාමහං**

## පියාට වැඳීම

**වුද්ධිකාරෝ ආලිංගිත්වා - චුම්බිත්වා පිය පුත්තකං**
**රාජමජ්ඣං සුපතිට්ඨං - පීතු පාදං නමාමහං**

**ඉදං මේ පුඤ්ඤ කම්මං - ආසවක්ඛයා**
**වහන්හෝතු සබ්බ දුක්ඛා පමුඤ්චතු**

*(මේ පින්කම මට ආසවක්ඛය නම්, නිවනට හේතු වේවා)*

**දුක්ඛප්පත්තාච නිද්දුක්ඛා - භයප්පත්තා ච නිබ්භයා**
**සෝකප්පත්තාච නිස්සෝකා - හොන්තු සබ්බේ'පි පාණිනෝ**

*(දුකින් පෙලෙන සත් දුකින් මිදෙත්වා, බියෙන් වෙසෙන සත් බියෙන් මිදෙත්වා, සොවින් තැවෙන සත් සොම්නස් වෙත්වා,ද නිතින් මේ හැම සත් සුවපත් වෙත්වා)*



## තෙරුවන් කමා කර ගැනීම

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං කම මේ භන්තෙ - භූරිපඤ්ඤ තථාගත**

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං කම මේ ධම්ම - සන්දිට්ඨික අකාලික**

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං කම මේ සංඝ - සුපටිපන්න අනුත්තර**

*(මගේ සිතින්, කයින්, වචනයෙන් මගේ යම් ප්‍රමාදයකින් සිදු වූ වරදක් වෙත්නම්, ස්වාමීනි, පළල් ප්‍රඥා ඇති බුද්ධරත්නයෙන් මට සමාව ලැබේවා, අකාලික වූ ධර්ම රත්නයෙන් මට සමාව ලැබේවා, අනුත්තර වූ සුපටිපන්න ගුණයෙන් සමන්විත සංඝරත්නයෙන් මට සමාව ලැබේවා)*

**දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හේතු ච**
**පීතෝ භවතු ලෝකේ ච - රාජා භවතු ධම්මිකෝ**

*(ශාස්‍ය සම්පත්තියට හේතු වූ වැසි, කලට වසීවා ලොව සමෘද්ධිමත් වේවා. රජ දැහැමි වේවා.)*

**අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධාපචායිනෝ**
**චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණෝ සුඛං බලං**

*(සිල්වත් උතුමන් වන්දනා කරනවා නම්, ගුණයෙන්, නුවණින් වැඩිහිටියන්ට නිතර සලකනවා නම්, ඔහු තුළ ආයුෂ, වර්ණය, සැපය, බලය යන මේ ගුණ හතරම වැඩෙයි)*

## පුණ්‍ය ප්‍රාර්ථනා

**මා විසින් රැස් කළා වූ සීලමය වූ වන්දනාමය වූ භාවනාමය වූ බුද්ධ පූජාමය වූ සියළු පුණ්‍ය ධර්මයෝ පින් කැමති දෙවියෝ අනුමෝදන් වෙත්වා. ඒ සියලු දෙවියෝ සැපයෙන් සැපයට පත්වෙත්වා. සැනසීම ලබත්වා.**

**අප නමින් මියගියා වූ සියළු ඥාතීන්ටද මේ පින අනුමෝදන් වෙත්වා. ඒ ඥාතීන් සියළු දෙනාම සියලු සැපයට පත් වෙත්වා. සැනසීම ලබත්වා.**

අප සියලු දෙනාට ද මේ පින් අනුමෝදන් වී දුක් කරදර දුරුවේවා. සැනසීම උදා වේවා. මෙලොව ජීවිතය වාසනාවන්ත වේවා. පරලොව ජීවිතය සුගතියම හිමි වේවා. අප සියළු දෙනාටම බුදු පසේ බුදු, මහ රහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වැඩියා වූ නිත්‍ය මංගල වූ පරම සුන්දර වූ අමා මහ නිවනම අවබෝධ වීම පිණිස ම මේ පුණ්‍ය ධර්මයන් හේතු වේවා. වාසනා වේවා.

## මෛත්‍රී භාවනාව

අහං අවේරෝ හෝමි - අව්‍යාපජ්ජෝ හෝමි
අනීඝෝ හෝමි - සුඛි අත්තානං පරිහරාමි
*(මම වෛර නැත්තෙක් වෙම්වා, මම තරහ නැත්තෙක් වෙම්වා, මම දුක් පීඩා නැත්තෙක් වෙම්වා, මම සුවසේ ජීවත් වෙම්වා)*

මා මෙන්ම, මාගේ මව්පියෝද, ආචාර්ය උපාධ්‍යායෝද, හිතවත් සත්වයෝද මැදහත් සත්වයෝද, වෛරී සත්වයෝද, වෛර නැත්තෝ වෙත්වා. තරහ නැත්තෝ වෙත්වා. දුක්පීඩා නැත්තෝ වෙත්වා සුවසේ ජීවත් වෙත්වා දුකින් මිදෙත්වා තම තමන්ගේ කර්ම ශක්තියේ පමණට ලැබුවා වූ සම්පත්තියෙන් සතුටු වෙත්වා.

මේ විහාරයෙහිද, මේ ගමෙහිද, මේ නගරයෙහිද, මේ ලංකාද්වීපයේද, මේ දඹදිවද, මේ සක්වලද වසන්නා වූ සියලුම සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා තරහ නැත්තෝ වෙත්වා දුක්පීඩා නැත්තෝ වෙත්වා සුවසේ ජීවත් වෙත්වා. දුකින් මිදෙත්වා, තමතමන්ගේ කර්ම ශක්තියේ පමණට ලැබුවා වූ සම්පත්තියෙන් සතුටු වෙත්වා.

නැගෙනහිර දිසාවෙහිද, දකුණු දිසාවෙහිද, බටහිර දිසාවෙහිද, උතුරු දිසාවෙහිද, නැගෙනහිර අනුදිසාවෙහිද, දකුණු අනුදිසාවෙහිද, බටහිර අනුදිසාවෙහිද, උතුරු අනුදිසාවෙහිද, යට දිසාවෙහිද, උඩ දිසාවෙහිද, වාසය කරන්නා වූ සියලුම සත්වයෝ, සියලුම ප්‍රාණීහු, සියලුම භූතයෝ, සියලුම පුද්ගලයෝ, සියලුම ජීවිත ලැබූ අය, සියලු



ස්ත්‍රීහු, සියලු පුරුෂයෝ, සියලු ආර්යයෝ, සියලු අනාර්යයෝ, සියලු දේවියෝ, සියලු මනුෂ්‍යයෝ, සියලු අමනුෂ්‍යයෝ, සියලු තිරිසන්නු, සියලු ප්‍රේතයෝ, වෛර නැත්තෝ වෙත්වා, තරහ නැත්තෝ වෙත්වා, දුක්පීඩා නැත්තෝ වෙත්වා, සුවසේ ජීවත් වෙත්වා, දුකින් මිදෙත්වා, තම තමන්ගේ කර්ම ශක්තියේ පමණට ලැබුවා වූ සම්පත්තියෙන් සතුටු වෙත්වා.

මම වෛර නැත්තෙක් වෙම්වා, තරහ නැත්තෙක් වෙම්වා, ඊර්ෂ්‍යා නැත්තෙක් වෙම්වා, දුක්පීඩා නැත්තෙක් වෙම්වා, සුවසේ ජීවත් වෙත්වා, ශාන්ත සුවයට පත් වෙම්වා.

මා මෙන්ම, මේ නිවසේ සිටින සියලුම සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, තරහ නැත්තෝ වෙත්වා, ඊර්ෂ්‍යා නැත්තෝ වෙත්වා, දුක් පීඩා නැත්තෝ වෙත්වා, සුවසේ ජීවත් වෙත්වා, ශාන්ත සුවයට පත් වෙත්වා.

මේ ගමේ සිටින සියලුම සත්වයෝ, මේ නගරයේ සිටින සියලුම සත්වයෝ, මේ පළාතේ සිටින සියලුම සත්වයෝ, මේ රටේ සිටින සියලුම සත්වයෝ, මේ ලෝකයේ සිටින සියලුම සත්වයෝ, තැති ගන්නා වූ සියලුම සත්වයෝ, තැති නොගන්නා වූ සියලුම සත්වයෝ,

මහා සිරුරු ඇති සියලු සත්වයෝද, දිග සිරුරු ඇති සියලු සත්වයෝද, මධ්‍යම සිරුරු ඇති සියලු සත්වයෝද, කුඩා සිරුරු ඇති සියලු සත්වයෝද, ඉතා කුඩා සිරුරු ඇති සියලු සත්වයෝද, පෙනෙන්නා වූ සියලු සත්වයෝද, නොපෙනෙන්නා වූ සියලු සත්වයෝද, දුර සිටින්නා වූ සියලු සත්වයෝද, ළඟ සිටින්නා වූ සියලු සත්වයෝද,

වෛර නැත්තෝ වෙත්වා, තරහ නැත්තෝ වෙත්වා, ඊර්ෂ්‍යා නැත්තෝ වෙත්වා, දුක්පීඩා නැත්තෝ වෙත්වා, සුවසේ ජීවත් වෙත්වා, ශාන්ත සුවයට පත්වේවා.

කිසිවෙක් කිසිවෙකුට වෛර නොකරත්වා, කිසිවෙක් කිසිවෙකුට අවමන් නොකරත්වා, කිසිවෙක් කිසිවෙකුට හිංසා නොකරත්වා, සියල්ලෝම සියල්ලන්ගේම සැප කැමැත්තෝ වෙත්වා, එක දරුවෙකු ඇති මවක සේ සියලු සත්වයන් කෙරෙහි අපමණ මෙත් සිත පතුරත්වා, වාඩි වී සිටින විටද, සක්මන් කරන විටද, සැතපී සිටින විටද, නොනිදා සිටින විටද, අපමණ ලෙස මෙත් සිත පතුරත්වා. සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, තරහ නැත්තෝ වෙත්වා, ඊරිසියා නැත්තෝ වෙත්වා, දුක්පීඩා නැත්තෝ වෙත්වා, සුවසේ ජීවත් වෙත්වා, ශාන්ත සුවයට පත්වෙත්වා.

උතුරු අනු දිශාවේ සිටින්නා වූ සියලුම සත්වයෝ, නැගෙනහිර දිශාවේ සිටින්නා වූ සියලුම සත්වයෝ, නැගෙනහිර අනු දිශාවි සිටින්නා වූ සියලුම සත්වයෝ, දකුණු දිශාවේ සිටින්නා වූ සියලුම සත්වයෝ, දකුණු අනු දිශාවේ සිටින්නා වූ සියලුම සත්වයෝ, බටහිර දිශාවේ සිටින්නා වූ සියලුම සත්වයෝ, බටහිර අනු දිශාවේ සිටින්නා වූ සියලුම සත්වයෝ, උඩ දිශාවේ සිටින්නා වූ සියලුම සත්වයෝ, යට දිශාවේ සිටින්නා වූ සියලුම සත්වයෝ, දස දිශාවේම සිටින්නා වු පමණ කළ නොහැකි සියලුම සත්වයෝ,

වෛර නැත්තෝ වෙත්වා, තරහ නැත්තෝ වෙත්වා, ඊරිසියා නැත්තෝ වෙත්වා, දුක්පීඩා නැත්තෝ වෙත්වා, සුවසේ ජීවත් වෙත්වා, ශාන්ත සුවයට පත්වේවා.

## ශාන්ති වාක්‍යය

බුද්ධ පූජාව සහ බෝධි පූජාව පවත්වා සෙත් පිරිත් සජ්ජායනය කර සියලු දෙවියන්ට පිං අනුමෝදන් කර නිම වූ පසු මෙම ශාන්ති වාක්‍යය පූජාව සඳහා මූලික වූ පුද්ගලයා හෝ පුද්ගලයින් අභිමුඛව සියලුම දෙනා ත්‍රිවිධ රත්නය කෙරෙහි විශ්වාසය සහ ගෞරවය මූලික කොටගෙන කියවා සෙත් ප්‍රාර්ථනා කරන්න.



මේ මහා භද්‍ර කල්පයේ සතරවන අන්තඃකල්පයේ අශ්වත්ථ බෝධි මූලයේ පස්මරුන් පරදවා ලොවුතුරා බුදු බවට පැමිණ වදාළා වූ දෙතිස් මහා පුරිස ලක්ෂණයෙන් අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් කේතුමාලාවෙන් ව්‍යාමප්‍රභවයෙන් ෂට්වර්ණ රශ්මි මාලාවෙන් බබලන්නා වූ අටළොස් රියන් ශ්‍රී දේහය ඇත්තා වූ වන්දනීයාතී වන්දනීය වූ පූජනීයාති පූජනීය වූ, අප ගෞතම සර්වඥරාජයාණන් වහන්සේ අනන්ත කරුණා ඇති සේක. අනන්ත ඥාණ ඇති සේක. අනන්ත සෘද්ධි ඇති සේක. අනන්ත බල ඇති සේක. අනන්ත යසස් ඇති සේක. ඒ ගෞතම සර්වඥයන් වහන්සේගේ ගුණානුභාවයෙන් උන්වහන්සේ විසින් සේවනය කරන ලද අශ්වත්ථ වහන්සේගේ ගුණානුභාවයෙන් නව ලෝකෝත්තර ධර්මානුභාවයෙන් අෂ්ටායර්‍ය පුද්ගල මහා සංඝ රත්නයේ ආනුභාවයෙන් බුද්ධ පූජා, බෝධි පූජා, පැවැත්වීමේ කුසලානුභාවයෙන්, ඒ පිං අනුමෝදන් වූ සියලු දේවියන්ගේ දේවතේජානුභාවය බලයෙන්.....

මේ . . . (නම ) හට රවි, චන්‍ද්‍ර, කුජ, බුධ, ගුරු, ශුක්‍ර, ශනී, රාහු, කේතු, යන නව ග්‍රහයන් නීච වීමෙන්, අස්ත වීමෙන්, වක්‍ර වීමෙන්, අනුවක්‍ර වීමෙන්, දුෂ්ඨස්ථානයන්ට පැමිණීමෙන් වූ මාරක, බාධක, රෝග කාරක, තත්ත්වනාසක, ධන නාශක, අපකීර්තිදායක, අපලයක් ඇත්තේ නම් ඒ අපල සියල්ල හිරු උදාවන කල්හි අඳුර දුරු වන්නාක් මෙන් වහා දුර්භූත වේවා.

මොහුගේ (මොහුගේ / මාගේ) ශරීරයෙහි වා, පිත්, සෙම්, යන තුන්දොස් කිපීමෙන් හෝ සප්ත ධාතුන් අඩු වැඩි වීමෙන් හෝ සෘතු විපර්යාසයකින් හෝ වස විසකින් හෝ අපථ්‍යාහාරයකින් හෝ අවලාද, ඇස්වහ, කටවහ, හෝවහ, හදි හූනියම් දෝෂයකින් හෝ යක්ෂ ප්‍රේතාදී භූත දෝෂයකින් හෝ හටගත්තා වූ යම්කිසි රෝගයක් ඇත්තේ නම් ඒ සියලු රෝගයෝ මොහුගේ (මොවුන්ගේ/මාගේ) ශරීරයෙන් වහා දුරුවේවා, මොහුට (මොවුන්ට/මාහට) වහා සුවය ලැබේවා.

මොහුට (මොවුන්ට/මාහට) ආයු වර්ධනය වේවා, ශත වර්ෂාධික කාලයක් ජීවත්වේවා, ධන වර්ධනය වේවා, බල වර්ධනය වේවා, සුඛ වර්ධනය වේවා, මොහුගේ (මොවුන්ගේ/මාගේ) සියලු යහපත් අදහස් බුද්ධානුභාවයෙන්, බෝධ්‍යානුභාවයෙන් වහ වහා මුදුන්පත් වේවා වේවා වේවා.

**ගරු ස්වාමීන් වහන්සේලාට වන්දනා කරන ගාථා**

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථෙරානං - ආගතං පටිපාටියා
සද්ධා සීලං දයාවාසං - බුද්ධ පුත්තං නමාමහං

*(සීලවන්ත වූ ගුණවන්ත වූ, නිරුත්තර වූ පුණ්‍ය ක්ෂේත්‍රයක් දුර්ලභාකාරයෙන් මා විසින් ලබා ගතිමි. වැඳීමට ද දැකීමටද සුදුසු උතුම් වූ සාරිපුත්තාදී මහා තෙරුන් වහන්සේලාගේ පිළිවෙලින් පැවතෙන සද්ධා සීල දයාවාස වූ පින්වත් බුද්ධ පුත්‍රයින් වහන්සේට මාගේ නමස්කාරය වේවා)*

## ශාසනික පුණ්‍ය ප්‍රාර්ථනා

අප මහා බෝසතාණන් වහන්සේ විසින් අසංඛ්‍ය කල්ප ලක්ෂයකට ඉහතදී තබන ලද පාරමී ධර්මයන් සිහිපත් කරමින් සත් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් සිතින් බුදු බව පැතූ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, නවාසංඛ්‍ය කල්ප ලක්ෂයක් වචනයෙන් බුදු බව පැතූ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, දීපංකර පාද මූලයේ පටන් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් දස පාරමී ධර්මයන් සමතිංසත් ආකාරයෙන් මනාව සම්පූර්ණ කළ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද,

එම කාලය තුල ලොව පහළ වූවා වූ පන් ලක්ෂ දොළොස්දහස් විසිහත් නමක් වූ බුදුරජාණන් වහන්සේලාගේ සත්‍යානුභාව බලයෙන්ද, ලොව සියල්ල විසිහත් නමක් වූ බුදුරජාණන් වහන්සේලාගේ සත්‍යානුභාව බලයෙන්ද, ලොව සියල්ල දන්නා වූ ලොවුතුරා බුද්ධත්වය



ලැබූ බව ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, එම බෝධි මූලයේදී අවබෝධ කළ නව ලොවුතුරා ශ්‍රී සද්ධර්ම රත්නය ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, එම සත්‍ය ධර්මය අවබෝධ කළ ධර්මයට අනුව පිළිවෙත් පුරන මහා සංඝරත්නය ඒකාන්ත සත්‍යයි එම සත්‍යානුභාව බලයෙන්ද සතර මාර්ග ඥාණ, ෂඩ් අසාධාරණ ඥාණ, දසබල ඥාණ, චුද්දස මහා ඥාණ, දොළොස මහා ඥාණ, අට්ඨාරස ආවේනික බුද්ධ ගුණ ඥාණ, සූවිසි කෝටිවාර අර්හත් ඵල වජ්‍රඥාණ, අනන්තඥාණය සමන්නාගත සමන්ත පට්ඨාන ප්‍රකරණ විෂයන්තර්ගත ගම්භීර ඥාණ ආදිය පරිවාර කොට ඇති සර්වඥතා ඥාණය අවබෝධ කළ බව ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද,

මහා සංඝ රත්නයේ ආනුභාව බලයෙන්ද, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආනුභාව බලයෙන්ද, පින් අනුමෝදන් වන දෙවියන්ගේ රැකවරණයෙන්ද, කළ්‍යාණ මිත්‍රයන් වහන්සේලාගේ මෛත්‍රී පූර්වාඞ්ගම ආශිර්වාද බලයෙන්ද, මාගේ මෙම ජීවිතය පුරා, සසර පුරා සිදුකළ ආමිස ප්‍රතිපත්ති කුසල් බලයෙන්ද, නිවන් දක්නා ජාති දක්වාම සුවසේ පාරමී ධර්මයන් පුරාගැනීමට යම් බඳු බාධාවක් වශයෙන් පැමිණ ඇති සියලුම අපල උපද්‍රව ග්‍රහදෝෂ සතුරු කරදර බාධක පීඩා අදෘෂ්‍යමාන බලවේග ආදී සියලු විපත්ති දුරුවේවා.

නිදුක් නීරෝගී භාවයෙන් සුවසේම ආමිස ප්‍රතිපත්ති ධර්මයන් පුරාගැනීමට භාවනා මනසිකාර දියුණු කර ගැනීමට ඇති සියලුම විපත්ති දුරු වේවා. සම්පත්ති ළඟා වේවා. අකුසල් සිත් දුරු වේවා. කුසල් සිත් පහළ වේවා. මෝහන්ධකාරය දුරුවේවා. ප්‍රඥා ලෝකය පහළ වේවා. අවිද්‍යා අන්ධකාරය දුරුවේවා. විද්‍යාලෝකය පහළ වේවා. අධර්මය දුරු වේවා. ධර්මය ළඟා වේවා. අසත් පුරුෂයෝ දුරු වෙත්වා. සත් පුරුෂයෝ ළඟා වේවා. අධමයෝ දුරුවෙත්වා. උත්තමයෝ ළඟාවීමෙන්ද ජනිත කරගත් කුසල්

ශක්තිය අපගේ නමින් මිය පරලොව ගිය සියලු ඥාතීන්ට මේ පින් බලයෙන් උපනූපන් ජීවිතයක් පාසාම සුගති සැප විඳිමින් සුවසේම පාරමී පුරා නිවන් අවබෝධ වේවා. ශාසන ආරක්ෂක ආත්ම ආරක්ෂක දිව්‍ය රාජ මණ්ඩලය මේපින් අනුමෝදන් වී අපත්, ශාසනයත්, අපේ ගෙවල්, දොරවල්, ඉඩකඩම්, යාන වාහන දූරුවන්ටත්, දේපල, වෙළඳ ව්‍යාපාර, රැකියා ස්ථානයත් ආදී සෑම දේටත් සෑම දෙනාටත් මැනැවින් දේවාරක්ෂාව ලබාදෙත්වා. දෙවියෝත් පතන බෝධියකින් නිවන් සුවය ලබත්වා. නිවන් සුවය අවබෝධ වෙත්වා. අපගේ මවුපිය දූදරු නෑදෑ හිතමිත්‍ර ආදී සියලුම ඥාතීන්ටත්, හිතවතුන්ටත් ආයුරාරෝග්‍ය සම්පත් ඇතුව සුවසේම මෙළොව පරලොව දෙව් මිනිස් දෙගතියෙහි සුවසේම පාරමී පුරාගෙන නිවන් සුවය අවබෝධ වෙත්වා. සොර සතුරු, ගිනිදිය, වස විස, අවි ආයුධයික්නි කිසිඳු අන්තරාවක් නොම වේවා. අපගේද, වෙළඳ ව්‍යාපාර, රැකීරක්ෂා, අධ්‍යාපන කටයුතු හා අනාගත යහපත් පුණ්‍ය ප්‍රාර්ථනා පූර්ණ චන්ද්‍ර මණ්ඩලයට සේ පිරී ඉතිරී සශ්‍රීක වී සෞභාග්‍යමත් අනාගතයක් උදාවේවා.

ශාසනය පිහිට කරගෙන තවත තවත් සීල සමාධි, ප්‍රඥා, දාන, ශීල, භාවනා, ආමිස, ප්‍රතිපත්ති, සමථ, විපස්සනා, යන ආදී ශාසනික සාරණීය ගුණධර්ම සුවසේම පාරමී වශයෙන් පුරාගෙන සුවසේම භාවනා අරමුණෙහි සිත පිහිටුවා සමාධී ඥාණ, භාවනා ඥාණ, විදර්ශනා ඥාණ, මාර්ග ඥාණ, ප්‍රතිපත්ති ඥාණ, අනුපිළිවෙලින් ලැබ සුවසේම ලෞකික ලෝකෝත්තර ප්‍රාර්ථනා මුදුන්පත් වී අති උතුම් පරම රමණීය ශාන්ති ලක්ෂණ නිර්වාණ අභයපුරයට පැමිණීම පිණිස ධර්මයටම පිහිට වේවා. උතුම් වු නිවන් අවබෝධය දක්වාම කළ්‍යාණ මිත්‍ර සම්පත්තිය සුවසේම ලැබේවා. සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා. නීරෝගී වෙත්වා. සුවපත් වෙත්වා. නිවන් අවබෝධයෙන් සසරෙන් එතෙර වෙත්වා.



**දෛනික ජීවිතයට ධර්ම කරුණු ස්වල්පයක් . . . .**

(අන්තර්ජාලය ඇසුරෙන්)

## අට මහා පිංකම්

### කඨින චීවර පූජාව

වස් පවාරණයෙන් එක් ස්ථානයක මහා සංඝරත්නය උදෙසා දෙපට සිවුර (පොට දෙකකින්) නිමකළ සිවුර, තනපට සිවුර, අඳන සිවුර යන තුන් සිවුරින් එක් සිවුරක් පූජා කිරීම

| | |
|---|---|
| **අටපිරිකර පූජාව** | 1. දෙපට සිවුර 2. තනිපට සිවුර 3. අඳන සිවුර 4. පාත්‍රය 5. දැළි පිහිය 6. ඉදිකටුව 7. බඳ පටිය 8. පෙරහන්කඩය ඇතුළත් පිරිකර කට්ටලය |
| **ආවාස පූජාව** | උපද්‍රවයන්ගෙන් තොරව විසීමට ආවාස පූජා කිරීම |
| **ධර්ම ලේඛනය** | අනාගතය උදෙසා ධර්ම පැවැත්වීමට ලේඛන කිරිම, කරවීම |
| **ඛෙත්ත පූජාව** | විහාරස්ථාන නඩත්තුව පිණිස ආදායම් උපදවන කෙත්වතු පූජා කිරිම |
| **පටිමාකරණය** | බුද්ධප්‍රතිමා නෙළීම හෙවත් උද්දේශික චෛත්‍ය කරවා පූජා කිරීම |
| **වච්චකුටී කරවීම** | සංඝරත්නයට වැසිකිලි, කැසිකිලි, කරවා පූජා කිරිම බුද්ධ ප්‍රමුඛ සාංඝික දාන බුදුන්වහන්සේ වෙනුවෙන් සධාතුක කරඬුව ප්‍රමුඛව සංඝරත්නයට දංදීම |

(දිවා රෑ පිං වැඩෙන පිංකම්ද, අටමහ පිංකම් යැයි සම්මත පිංකම් ඇතුළුව ඕනෑම පිංකමක් සිදුකරන විට පිරිස සම්බන්ධ කර ගැනීම තුළින් පිරිවර සම්පත්තිය ලැබීමට හේතුවන පිංකමක් බව විශේෂයෙන් මතක තබාගත යුතු කරුණකි.)

## සතර අපාය

අපාය යනු සැපයෙන් පහවූ ස්ථාන යන අදහසයි. කොතරම් දුක් පීඩා විඳින මනුෂ්‍යයන් ජීවත්වන ස්ථානයක් වුවද අපායක් ලෙස අපට හැඳින්වීමට නොහැක. හේතුව නම් ඊට වඩා දුක්ඛ ස්ථානය අපාය වන බැවිනි. අපාය සතරක් ලෙස දැක්වුවද, එහි ප්‍රභේද

ඇත. ඒ අතර අපට පෙනෙන-නොපෙනෙන අපායික සත්වයෝ ඇත්තාහ. අප සමග ජීවත්වන සතුන් හා අනෙක් පෙනෙන සතුන් තිරිසන් අපායික සතුන්ගෙන් කොටසකි. මරණාසන්න මොහොතේ කළාවූ අකුසල කර්මයන් සිහිවීමෙන් ඊට අදාළ අපාය භූමියේ උපදියි. මනුෂ්‍යයන් හට උපකාර කළ හැකි අපායික සතුන් වන්නේ පෙනෙන තිරිසන් සතුන්ට හා නොපෙනෙන පරදත්තූප ජීවී භූත කොට්ඨාශයට පිං දීමෙනි. අන් සත්වයන්ටද මෛත්‍රිය වැඩීමෙන් මානසික සුවයක් යම් පමණකට ඇති කර දිය හැක. පෙනෙන-නොපෙනෙන අපායික භූමි පිළිබඳ දීර්ඝ විස්තරයක් ධර්මයේ සඳහන්ව ඇත.

## ප්‍රේතයන්ගේ ප්‍රභේද

| | |
|---|---|
| **වන්තාස** | සෙම්, සොටු ආහාර කොට ජීවත්වන |
| **කුණපාස** | මිනිසුන්ගේ සතුන්ගේ මළකුණු ආහාරයට ගන්නා |
| **ගූථඛාදක** | අසූචි ආහාර කොට ගන්නා |
| **අග්ගිජාලමුඛ** | කටින් නික්මෙන්නා වූ ගිනිදැල් ඇති |
| **සූචිමුඛ** | ඉදිකටු මලක් පමණ මුඛය ඇති මහා සැළියක් පමණ බඩ ඇති |
| **තණ්හට්ටිත** | සා පිපාසාවෙන් නිතර පෙළෙන බැවින් ආහාරපාන ආශාවෙන් පෙළෙන |
| **සුනිජ්ඣාමක** | ගින්නෙන් දා ගිය කණුවක් මෙන් වියළී ගිය ශරීර ඇති |
| **සත්ථංග** | ආයුධ වැනි වූ තමාගේ ශරීරයම කැපෙන නිය ආදී ඇති |
| **පබ්බතංග** | පර්වත ප්‍රමාණ වැනි විශාල ශරීර ඇති |
| **අජගරංග** | පිඹුරන්ගේ ශරීර වැනි ශරීර ඇති |
| **වේමානික** | විමානවල ඉපිද සැපදුක් දෙකම කලින් කල විඳින |
| **මහිද්ධික** | කැලෑවල වාසය කරන්නා වූ මහත් සෘධි ඇති |

## නැවත ඉපදීම පිළිබඳ බුදුන්ගේ උපමාවක්

බුදුන් වහන්සේ දිනක් නිය පිටට පස් ටිකක් ගෙන මහ පොළොවේ පස්ද, නියපිට පස්ද වැඩි යන ප්‍රශ්නය විමසා දේශනා කළේ මනුෂ්‍යයන්ගෙන් නැවත මනුෂ්‍යයන් වී උපදින්නේ නිය පිට ඇති පස් වැනි ස්වල්ප දෙනෙක් බවයි.



- අටමහා නරකයන්ගෙන් අවීචිමහා නරකය විස්තර කළ නොහැකි තරම් දුක් ඇති අපායකි.
- මහා නරකයට පත්වීමට පෙර ඔසුපත් නරකය තුළදී කල පින්කම් සිහිගන්වන්නා යමරජු ලෙස දැක්වේ.
- මරණාසන්න මොහොතේ කල අකුශල කර්මයක් සිහිවීමෙන් ප්‍රතිසන්ධිය ලබන්නේ අපාය සතරෙන් එකක වෙයි.
- සතර අපායෙන් නිදහස් වීම සෝවාන් මාර්ග ඥානය පහළ වීමෙන් සිදුවේ.
- අවීචි මහා නරකයේ පැසෙන්නා වූ දේවදත්ත හාමුදුරුවන්ගේ ශරීරය සියක් යොදුන් බව දැක්වේ.
- තුණුරුවන් කෙරෙහි මහත් සද්ධාවෙන් කටයුතු කළ අජාසත්ත රජු මහා නරකයට නොවැටි ඔසුපත් නරකයට පත්වූ බව සඳහන් වේ
- බෝධිසත්වයන් ඉපදුණු මොහොතේ, මොහොතක් අපාය ගිනිදැල් නිවුණු බව සඳහන් වේ.
- ලෝක විනාශයේදී අපායික සත්වයන් වෙනත් සක්වල අපාය භූමිවල උපදිති

## නිතර කරන්නාවූ පිංකම්වල අනුසස්

| | |
|---|---|
| **මල් පූජාව** | සුගති භවයන්ගේ උප්පත්තියට හේතුවීම, බොහෝ දෙනාට ප්‍රිය අයකු වීම, දුටුවන් වශීවන රූප ශෝභාවක් යුක්ත වීම |
| **පහන් පූජාව** | ප්‍රඥාව ලැබීමට හේතුවීම, හොඳ ඇස් ලැබීමට හේතුවීම, දිවැස් ලැබීමට හේතු වීම, |
| **සුවඳ පූජාව** | උපසුපන් ජාතියේ සැමට ප්‍රිය අයෙකුවීම, වහා අවබෝධ වන නුවණ ඇත්තෙක් වීම, සුගති භවයන්ගේ උප්පත්තියට හේතුවීම |
| **පැන් පිදීම** | ආයුෂයෙන්, වර්ණයෙන්, සැපයෙන්, පිරිවරින්, ආධිපත්‍යයෙන්, රූපයෙන්, ශබ්දයෙන්, ගන්ධයෙන් රසයෙන්, යනාදී කරුණු වලින් දෙව්ලොවදී අන් දිව්‍යගනන් ඉක්මවා සිටීම. |
| **ආහාරපාන පිදීම** | බොහෝ ආයුෂ ඇත්තේ වීම, බලවත් වීම, ධෛර්ය ඇත්තෙක් වීම, වර්ණ ඇත්තෙක් වීම, යසස් ඇත්තෙක් වීම, සුව ඇත්තේ වීම, ආහාරපාන ලැබීම, ශූරවීම, නුවණැති වීම |

| | |
|---|---|
| **ගිලන්පස පිදීම** | ආයුෂය, ශරීර ශක්තිය, නුවණ, ශරීරයේ යහපත් පැහැය, පිරිවර, සැපය උපද්‍රව නැතිබව, ගොවිතැන් පාළුවීම ආදී ව්‍යසන නැතිවීම, ගරු බුහුමන් ලැබීම, ප්‍රියයන්ගේ වෙන්වීමේ දුක් නැතිවීම. |

- පිංකම් වලින් ලැබෙන අනුසස් අඩුවැඩිවීම දායක-ප්‍රතිග්‍රාහක දෙපක්ෂයේ සිල්වත් බවත්, පූජා වස්තුව උපයා ගැනීමේ ධාර්මික බවත්, පූජාව සිදුකරන දායකයා එහි අනුසස් දන සිත පහදවා ගන්නා ආකාරය අනුව සිදුවන බව විශේෂ කරුණකි.
- සිදුකරන සියළු පිංකම් මහත්ඵල මහානිසංස වීමට හේතු-ඵල ධර්මය දන ඒ ගැන විශ්වාසය ඇති කරගෙන කළ යුතුය

**දන් දීමේදී ප්‍රාර්ථනාව විය යුත්තේ,** තමන් සතු කුමන හෝ ද්‍රව්‍යයක් අන් අයගේ ප්‍රයෝජනයට මුදා හැරීමෙන් එහි අයිතිය තමන්ට අහිමි වන්නේය. එමගින් ඒ හා බැඳී තිබූ ලෝභය දුරු වන්නේය. එම නිසා ප්‍රාර්ථනාව විය යුත්තේ මේ හා බැඳී තිබූ ලෝභය දුරුවූවා සේ සියළු සංස්කාරයන් කෙරෙහි ලෝකය හෙවත් තෘෂ්ණාව නැති කිරීමට හේතු වේවා යන ප්‍රාර්ථනාවයි.

**සංඝයා උදෙසා දන් පූජා කරන විට,** දාන වස්තුව ඉදිරිපස තබා වාක්‍යයක් කියා මනසින් එහි අයිතිය සඟ සතු කරයි. එහෙත් සංඝයා වහන්සේට එහි පරිභෝජන අයිතිය ඇත්තේ රියන් දෙකහමාරක් දුර සිට පාත්‍රයට හෝ භාජනයකට හෝ සංඝයා වහන්සේගේ ශරීරය ස්පර්ශ කර සිටින මේසයක් මත තබන දේ පමණි. සංඝයා නැවත වැඩමවීමෙන් හෝ විකාල පැමිණීමෙන් (ඉර අවරට යාමේ ආරම්භය) එහි අයිතිය සංඝරත්නයට නැත.

- ■ දාන මහත්ඵල වීමට තමන්ගේ සිල්වත් බව, ධාර්මිකව උපයාගත් වස්තුව, ලබන්නාගේ සිල්වත් බව බලපායි.
- ■ යමක් දීමෙන් පසු ඒ ගැන නැවත නැවත සිහිකර සිත සතුටු කර ගැනීම පින වැඩිවීමට හේතුවේ.



- ■ දෙන දෙයට අනුරූපව යමක් ලැබීම හේතුඵල ධර්මතාවයයි. ප්‍රාර්ථනයක් අවශ්‍ය නැත. (නිවන ප්‍රාර්ථනය හැර)
- ■ දීමට යමක් නැත්නම් පෙර දුන් දෙයක් ගැන හෝ අන් අය දෙන දේ ගැන සතුටු වීමත් පිං කමකි.

## ජීවිතයේ අවසාන මොහොත

එක් ජීවිතයක අවසාන මොහොත, චූති චිත්තය පහළ වන අවස්ථාවයි. චූති සිතට අරමුණු වන ආරම්මණයට අනුව අභිනව භවය තීරණය වන්නේය. එබැවින් අතීතයේ සිට සැදැහැවතුන් ගතකරන ජීවිතය තුලදී සිදුකරන පිංකම් මතකයේ රඳවා ගැනීම සඳහා පිං පොතක් සකස් කරගෙන ඇත. මෙම ජීවිතයේ කෙළවරදී එය කියවා හෝ කියවාගෙන සිතේ සතුටින් සිට අවසාන මොහොතේ සිහි බුද්ධියෙන් ජීවිතයෙන් සමුගැනීම ඒ තුලින් බලාපොරොත්තු විය. මෙම නිසාම ඔවුනට අභිනව භාවය දෙව්-මිනිස් සුගති භවයක් ලබන්නට හේතුවී ඇත.

**"බොහෝ පින් දහම් සිදුකරගෙන සිටියද යම් යම් කටයුතුවල නිරතවීමේදී තුණුරුවන් කෙරෙහි සිහිය නොමැති වන බැවින් එවැනි අවස්ථාවක මිය ගියහොත් කොතැනක මා උප්පත්තියක් ලබයිද?" යන ප්‍රශ්නය මහානාම ශාක්‍ය රජතුමා බුදුන්වහන්සේගෙන් විමසීය.**

"බොහෝ කලක් තුලදී යමෙකුගේ සිතේ ශ්‍රද්ධාව, සීලය, ශ්‍රැතය (බොහෝ ධර්මය අසා, ධාරණය කොට සිටීම) ත්‍යාගය හා ප්‍රඥාව දියුණු වී තිබේ නම් යමෙක් ගිතෙල් හෝ තෙල් බඳුනක් ඉතා ගැඹුරු වූ පොකුණකට ඔබා සිඳ දමුවහොත් ඒ බඳුන් කැලි පතුලට ගිලා බසින මුත් එහි ඇති ගිතෙල් හෝ තෙල් දිය මතුපිටට පැමිණෙන්නේය. රජතුමනි, එසේම ඔබ බොහෝ කලක් ශ්‍රද්ධාදී මෙම කුසල ධර්ම බොහෝ දියුණු කර ඇති බැවින් මරණය නිර්දෝෂීව සිදු වන්නේයැයි" බුදුන්වහන්සේ වදාළහ.

**- තෙරුවන් සරණයි -**